# කුමාරතුංග මුනිදාස සාහිත්‍ය නිර්මාණ තුළින් පිළිබිඹු කෙරෙන ජාතික සංවර්ධන අර්ථ ශාස්ත්‍රීය දෘෂ්ටිවාදය

Sri Lanka Journal of Economic Research
Volume 7(1) December 2019
SLJER.07.01.P:
pp. 137-169.
Sri Lanka Forum of University Economists
SLJER

**තෙවරාතන්ත්‍රිගේ ලලිතසිරි ගුණරුවන්**

**විදාන ගමගේ කල්පනී යසෝධා**

---


## සාරසංක්ෂේපය

*කුමාරතුංග මුනිදාසයෝ විසි වැනි සියවසේ මුල් භාගයේ ජීවත් වූ ප්‍රවීණ විද්වතෙකි. සිංහල භාෂාව පිළිබඳ විශාරදයකු, සාහිත්‍යධරයකු හා ප්‍රවීණ ව්‍යාකරණවේදියකු ලෙස ශ්‍රී ලාංකේය ජන සමාජය විසින් හඳුනා ගනු ලැබ ඇති එතුමන් ගේ කෘතිවලට එබී බැලීමේ දී ඒවා තුළින් අර්ථ ශාස්ත්‍රීය  දෘෂ්ටිවාදයක් ද පිළිබිඹු වෙයි. ජාතික සංවර්ධනය පිළිබඳ තේමාවේ විවිධ පැතිකඩ එතුමන් ගේ සාහිත්‍ය නිර්මාණ ඔස්සේ ආමන්ත්‍රණය කරනු ලැබ ඇත. ඒ නිරීක්ෂණය පාදක කර ගනිමින් කුමාරතුංග මුනිදාසයන් ගේ සාහිත්‍ය නිර්මාණ ආර්ථික විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විමසා බලා ඒ තුළින් නිස්සාරණය කර ගත හැකි සංවර්ධන ආර්ථික උපායමාර්ගික දැක්මක් තිබේ දැයි විමසා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. එසේ නිස්සාරණය කෙරෙන ප්‍රතිපත්ති දිශානතීන් වර්තමාන සන්දර්භයේ ප්‍රකට ආර්ථික න්‍යායයන් වන සම්භාව්‍යවාදී, කේන්සියානුවාදී හා සමාජවාදී ආර්ථික ගුරුකුල සමඟ සමපාත වන හෝ විතැන් වන හෝ අයුරු ඉන් විමසුමට ලක් කෙරෙයි. එ වැනි සමානතා යම් තාක් දුරට දැකිය හැකි වුව ද, කුමාරතුංගයන්ගේ ලේඛනවලින් නිරූපණය කෙරෙන එතුමා ගේ ආර්ථික දැක්ම වෙසෙසින් ම නව ලිබරල්වාදී දේශපාලන ප්‍රවාහයට සහ නව සම්භාව්‍යවාදී ආර්ථික න්‍යායයට අනුගත නොවන බව වටහා ගත හැකි ය. දේශවාත්සල්‍යය නව්‍ය වූ නිෂ්පාදන සාධකයක් ලෙස නිර්දේශ කළ හැකි තරමට ම කුමරතුඟු රචනා තුළින් දිස් වන අර්ථ ශාස්ත්‍රීය දැක්ම ඉතා ප්‍රබල ලෙස ස්වදේශිකවාදී හා ජාතික ස්වෛරීත්වවාදී රාමුවක පිහිටන බව නිගමනය කළ හැකි වෙයි. අපගේ සාහිත්‍ය උරුමයෙහි කැටි වී ඇති සංවර්ධන ආර්ථික ප්‍රතිපත්ති දිශානතීන් පිළිබඳ මෙම කුමාරතුංග දැක්ම හුදු වෙළඳ පොළ කෙරෙහි ම අවධානය යොමු වුණු මෑත කාලීන ශ්‍රී ලාංකේය සංවර්ධන ප්‍රතිපත්ති තීරණය කිරීමෙහි ලා ප්‍රමාණවත් ව උපයෝජනය වී නොමැති බව ද, දේශමාමකත්වයෙන් තොර වූ ආර්ථික වෘද්ධියක් තිරසර ජාතික ස්වෛරීත්ව සංවර්ධනයකට තුඩු නොදෙනු ඇති බව ද, ඒ අනුව බැසෑ ගත හැකි අනුමිතිය යි.*


ප්‍රවේශ වදන්: *විකල්ප ආර්ථික දෘෂ්ටිවාද, ජාතික සංවර්ධනය, ශ්‍රී ලංකාව, කුමාරතුංග මුනිදාස*

## ABSTRACT

*Cumaratunga Munidasa was an intellectual who lived in the first half of the 20th Century, who was well recognized in the Sri Lankan society as an expert in Sinhala language, grammar and poet. However, a glance into his literary writings would reflect an economic vision as well. Many a cross-section of the theme of national development appears addressed in his innovative literary constructions. Based on that observation, the present research intended to examine Cumaratunga writings at an economic philosophical angle to explore the possibility of extracting a strategic vision on economic development through such writings. It also analyses the extent to which such extracted policy directions conform to or differ from those teachings of well-known economic schools of thought such as classical school, Keynesianism or Socialism. In spite of some such parallels, a fundamental inference in this research is that the Cumaratunga economic vision essentially is not in conformity with the neo-liberal political mainstream and neo-classical economic rationale. It concludes that the economic vision perceivable in Cumaratunga writings is very strongly patriotic and national sovereignty-oriented, to such an extent that "patriotism" could even be perceived as a novel factor of production. The research observes that this Cumaratunga economic vision as revealed from our literary heritage has not been adequately deployed in determining development policies of Sri Lanka in the recent past. It also enables to deduce that an economic growth devoid of patriotism cannot lead the nation towards sovereign and sustainable development.*



*Key Words :* *Alternative Economic Thought, National Development, Sri Lanka, Cumaratunga Munidasa*

JEL Codes: F52, F63, P16, P51, Z18


---


**තෙවරාතන්ත්‍රිගේ ලලිතසිරි ගුණරුවන්**

*ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය.*

**විදාන ගමගේ කල්පනී යසෝධා**

*ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය.*

## හැඳින්වීම

ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ ඉගැන්වෙන ප්‍රධාන අර්ථ ශාස්ත්‍රීය න්‍යායික පදනම් ඒ ඒ රටවල් විසින් ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමේ දී ඒ න්‍යායාත්මක ප්‍රවේශයන්ට අනුගත වී ඇති අවස්ථා මෙන් ම ඒවායින් බැහැර වී ඇති ප්‍රවණතා ද තිබේ. විශේෂ වශයෙන් එ වැනි බැහැරවීම්වල දී අදාළ පිළිවෙත් තම රටවල වාස්තවික අවශ්‍යතා හා තත්වයන්ට අනුව විවිධාකාර ව ගළපා ගනු ලැබ ඇත. තම රටවල සංස්කෘතික, ඓතිහාසික මෙන් ම සාහිත්‍ය උරුමයන් ද මේ ප්‍රතිපත්ති ගළපා ගැනීම්වල දී භාවිත වී ඇති බව නිරීක්ෂණය කළ හැකි ය. උදාහරණ ලෙස, ප්‍රංශ විප්ලවය හා බැඳි දේශපාලන ආර්ථික අනුවර්තනයන්ට ජෝන්-ජැක් රූසෝ, රොබෙස්පියෙර්, මිරබෝ හා මොන්තෙස්කු වැනි සාහිත්‍යධරයන් ගේ හා දාර්ශනිකයන් ගේ දායකත්වය (Censer, 2019) මෙන් ම සෝවියට් විප්ලවයට පාදක වූ ජන විඥ්ඤාණයට තෝල්ස්තෝයි, ගොගොල් හා පුෂ්කින් වැනි ලේඛකයන් ගේ සාහිත්‍ය කෘතීන් ගෙන් ලැබී ඇති ආභාසය (Ali, 2017) සුළු පටු නැත. ඉන්දීය දේශානුරාගී අක්මුල් කෞටිල්‍ය ගේ ලේඛනයන්හි ගැබ් වී තිබීම [(Liebig, 2013), (Bhatia, 2016)] සහ චීන සමාජයේ ආර්ථික ආකල්පයන් කොන්ෆියුසියස්, ලාඕ-ත්සූ වැනි දාර්ශනිකයන් ගේ අදහස්වලින් ආභාසය ලැබීම [(MacCormick,1999), (Zicheng,2015)] මෙයට තවත් නිදසුන් සපයයි. එහෙත්, ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රතිපත්තිමය ප්‍රවණතා මේ හා සමඟ සංසන්දනාත්මක ව ඇගැයීමේ දී අප ගේ සාහිත්‍ය ප්‍රභවයන් කවර ප්‍රමාණයකට ඒ ප්‍රතිපත්ති ධාරාවන් සැකැසීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී උපයෝජනය වී ඇති ද යන්න ගැටලුවකි.

මෙහි එක් පැතිකඩක් ලෙස, විසි වැනි සියවසේ මුල් භාගයේ හෙළදිව විසූ පඬිවරුන් අතර අද්විතීය ස්ථානයක් හිමි කර ගන්නා කුමාරතුංග මුනිදාසයන් ගේ ලියැවිලි හා සාහිත්‍ය නිර්මාණ විමර්ශනය කිරීම ඔස්සේ ඒවා තුළින් අර්ථ ශාස්ත්‍රීය උපායමාර්ගික දැක්මක් ඉස්මතු වන්නේ දැයි විමැසීම මෙම පර්යේෂණයේ අරමුණ යි. එ සේ ම, එ වැනි දැක්මක් මෑත අතීතයේ රට තුළ ක්‍රියාත්මක කෙරුණු සංවර්ධන ප්‍රතිපත්ති දිශානතීන් සමඟ හා ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යයනය කෙරෙන ප්‍රධාන න්‍යායයන් සමඟ සංසන්දනාත්මක අගැයීමට ලක් කිරීම ද අපේක්ෂා කෙරෙයි. ඒ ඔස්සේ ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්කයන් ඉටු කර ගැනීම් වස් රටට ගැළපෙන උපාය මාර්ගික ඉදිරි දැක්මක් පිළිබඳ ආලෝකයක් ලබා ගත හැකි දැ යි විමසීම ද අරමුණු කෙරෙයි.

## විමර්ශන ක්‍රමවේදය

භාෂා විශාරදයකු, වෛයාකරණයකු, ග්‍රන්ථ ශෝධකයකු, කවියකු, පත්‍ර කර්තෘවරයකු වශයෙන් කුමාරතුංග මුනිදාසයන් ඉටු කර ඇති බහුවිධ මෙහෙවර සුවිශේෂ වෙයි. කුමාරතුංගයන් ගේ සාහිත්‍ය නිර්මාණ බොහෝ ය. ඒවා තුළින් හෙළයා ගේ ඉදිරි ගමනට මඟ පෙන්වන අදහස් ගණනාවක් ඉදිරිපත් කර ඇත. කුඩා දරුවන් ගේ මනස - රසඥතාව - දැක්ම වර්ධනය කිරීමෙහි ලා වෙසෙසින් උපස්තම්භක වන කෘතීන් අතර කියවන නුවණ, ශික්ෂා මාර්ගය, පිය සමර, හත් පණ, මඟුල් කෑම, කුමර ගී, විරිත් වැකිය, ප්‍රබන්ධ සංග්‍රහය සඳහන් කළ හැකි ය. වියරණ විමසුම් කෙරෙමින් එතුමා අතින් ලියැවුණු ව්‍යාකරණ

විවරණය, කුමාර ව්‍යාකරණය වැනි කෘතීන් භාෂා විශාරදයන්ගේ අගය කිරීමට පාත්‍ර වෙයි. තව ද, අධිරාජ්‍යවාදී පාලනය යටතේ ඇවෑමට යමින් පැවති හෙළ බස, රුස, දෙස යළි නඟා සිටුවන්නට සාහිත්‍යය අවියක් කර ගැනීමට එතුමා පියවර ගත්තේ ය. ලක් මිණි පහන හා සුබස වැනි සඟරා පළ කරමින් සහ හෙළ හවුල වැනි බල මුළු පිහිටුවමින් ජාතික මතවාදය මෝදු කිරීමට ගෙන ඇති වෙහෙස සුළු පටු නැත.

කුමරතුඟු මුනිදසුන් බහු-ක්ෂේත්‍රීය නිපුණයකු වුව ද,[1] එතුමා අර්ථ ශාස්ත්‍රීය මෙහෙවරක් ද කළ විද්වතකු ලෙස ශ්‍රී ලාංකික ජන සමාජය විසින් මෙතෙක් හඳුනාගනු ලැබ නැත.[2] එහෙත්, එතුමා ගේ කෘතීන් මඟින් ආර්ථික සංවර්ධනය පිළිබඳ බොහෝ අදහස් උදහස් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වෙයි. එ බැවින්, කුමාරතුංගයන් ගේ ඒ අදහස් තුළින් පිළිබිඹු වෙන ආර්ථික උපායමාර්ගික දැක්ම ද්විතීයික සාහිත්‍ය ප්‍රභවයන් ඔස්සේ නිස්සාරණය කිරීම හා රට තුළ එතෙක් මෙතෙක් ක්‍රියාත්මක වෙන ආර්ථික පිළිවෙත් ඒ දැක්ම සමඟ සමපාත වන හෝ විතැන් වන හෝ අයුරු ඇගැයීම මෙහි යොදා ගැනෙන විමර්ශන ක්‍රමවේදය යි.

මූලික වශයෙන් ආඛ්‍යානමය දේශපාලන-ආර්ථික විමර්ශන ක්‍රමය මෙම විමසුමේ දී උපයෝජනය කර ගැනීමට අපේක්ෂිත යි.

---

[1] කුමාරතුංගයන් සමාජ දාර්ශනිකයකු බව හරිශ්චන්ද්‍ර විජයතුංගයෝ සිය කුමාරතුංග ගේ සමාජ දර්ශනය නමැති පොතේ සඳහන් කරති. එතුමා ජාතික නිදහස පතා අධිරාජ්‍ය විරෝධී සටනෙහි පුරෝගාමියකු ලෙස සහ සිංහල මහා සභාවේ සාමාජිකයකු ලෙස ද හඳුන්වා දෙනු ලැබ ඇත (විජයතුංග, 2001, 15 පිටුව). එතුමා තුළ පැහැදිලි දේශපාලන දර්ශනයක් ද වූ බව ලක් මිණි පහනට ලියූ විවිධ කතු වැකිවලින් සනාථ වෙයි. තව ද, කුමාරතුංගයෝ වෘත්තියෙන් මෙන් ම විමැසුමෙන් ද පෘථුල අධ්‍යාපනඥයෙකි (ලක් මිණි පහන් කතු වැකි, 2006, 12, 23, 29, 36, 72, 99, 109, 148, 149, 180 232, 238, පිටු). සිංහලයා ගේ අක් මුල් ඉන්දීය ආක්‍රමණිකයකු වන විජයට ගැට ගැසූ සාම්ප්‍රදායික මතයට එරෙහි වෙමින්, තාරක-රාවණ-පණ්ඩුකාභය-දුටුගැමුණු ප්‍රමුඛ දේශීය යක්ෂ ගෝත්‍රික ප්‍රවේණිය ඉස්මතු කළ බවට විලියම් අල්විස් වෛද්‍යාචාර්යතුමා 1945 දී 'සිංහල බලයට' ලියූ ලිපියෙන් නිරීක්ෂණය වන්නේ කුමාරතුංගයන් ඉතිහාස විෂයය ද විවේචනාත්මක වැ ස්පර්ශ කළ බව යි [සිටිනාමළුවේ සුමනරතන හිමි (සංස්.) 1955, 61 පිටුව]. එ සේ ම, බෞද්ධ දාර්ශනික අදහස් පිළිබඳ ව ද කුමාරතුංගයන් සතු වැ තිබූ ප්‍රවීණත්වය ආගමික මතිමතාන්තර, භික්ෂූත්වය, පරලොව හා මෙලොව අතර කෙරෙන සැසැඳීම් සහිත ලේඛනයන් මඟින් පිළිබිඹු කෙරෙයි (විශේෂ වශයෙන්, ලක් මිණි පහන් කතු වැකි, 2006, 44, 68, 123, 135, 171, පිටු). නූතන විද්‍යා විෂයයන් පිළිබඳ ව ද එතුමා තුළ මනා පරිචයක් තිබූ බව "සුවහස් නය මනැසි ඉසිවරයාණෝ" කෘතියට ලිපි සැපැයූ අලවත්තාගොඩ ජේමදාස මැහැඳුරන් ගේ හා ඩී.වී.ජේ. හරිශ්චන්ද්‍ර මනෝවෛද්‍යතුමන් ගේ මතය යි [සිටිනාමළුවේ සුමනරතන හිමි (සංස්.) 1955, 229-250 සහ 381-410 පිටු].

[2] *ගුරු දෙව් කුමාරතුංග මුනිදාස මහ හෙළයාණෝ* නමින් මුද්‍රණය වී ඇත්තා වූ කුමාරතුංග 75 වැනි ගුණ සමරුවේ දී "කුමාරතුංගයන් රට දුටු හැටි" තේමාවෙන් ඒකනායක රුවනුන් විසින් කැරුණු දෙසුමේ "යහපත් ආර්ථිකයක ලක්ෂණ" නමැති අනුමාතෘකාවෙන් යුතු කොටස මේ පිළිබඳ ව ලියැවී ඇති විරල සටහනකි (ඒකනායක, 2019).

## කුමාරතුංගයන් ගේ අර්ථ ශාස්ත්‍රීය දැක්ම

කුමාරතුංග මුනිදාසයන්ගේ සාහිත්‍ය නිර්මාණ හා විවිධ රචනා විමර්ශනයට ලක් කිරීමෙන් නිස්සාරණය කර ගත හැකි ආර්ථික උපායමාර්ගික නිර්දේශ අතර අර්ථ ශාස්ත්‍රීය ගුරුකුල තුළ පිහිටන්නා වූ දිශානතීන් හඳුනා ගනු ලැබිය හැකි ය. කේන්සියානු රාමුවට නැකම් කිව හැකි යැයි අර්ථ ශාස්ත්‍රඥයන් විසින් වර්ගීකරණය කරනු ලැබිය හැකි අදහස් ඒ අතර කැපී පෙනෙයි. විසි වැනි සියවසේ මුල් භාගය නියෝජනය කළ ශාස්ත්‍රඥයකු විලස ඒ අවදියේ ප්‍රබල බලපෑමක් එල්ල කළ සමාජවාදී කඳවුරේ ප්‍රතිපත්තිමය අරමුණක් වූ සමාජ සාධාරණත්වය පිළිබඳ අදහස් ද කුමාරතුංග ලේඛනයන් මඟින් පිළිබිඹු වීම අහඹුවක් නො වේ. එහෙත්, නව සම්භාව්‍යවාදී ආර්ථික න්‍යායයන්ට විටෙක ආභ්‍යන්තරික විවේචනයක් ද ලෙසින් දකිනු ලැබිය හැක්කා වූ මෑත දී ඉදිරිපත් කෙරුණු තිරසර සංවර්ධනය පිළිබඳ අදහස් දශක හතකට පමණ ඉහත දී ඉස්මතු කර දැක්වීමට කුමරතුඟු ආර්ථික දැක්ම සමත් වී තිබීම විශේෂත්වයකි. වඩාත් කැපී පෙනෙන්නේ මේ ප්‍රධාන ප්‍රවාහ රාමුවලින් ඔබ්බෙහි පිහිටිය හැක්කා වූ ජාතික ආර්ථික දැක්මක් පිළිබඳ නව්‍ය හා නිර්මාණශීලී අදහස් ය.

### *රාජ්‍ය මැදිහත්කරණවාදී මුහුණුවර*

ආර්ථික ප්‍රගමනයෙහි ලා රාජ්‍ය මැදිහත්කරණයේ වැදගත්කම කේන්සියානු දැක්මේ කේන්ද්‍රීය ලක්ෂණයකි. රාජ්‍ය ආයෝජන ඔස්සේ ආර්ථික මෙන් ම සමාජ ප්‍රාග්ධන සම්පාදනය හා ඒ තුළින් ආර්ථිකයට එකතු කෙරෙන නව සංවර්ධන ජවයත් ඒ උදෙසා වූ රාජ්‍ය වියදම් දේශීය ව්‍යවසායකත්වයට ආදායම් ලෙස උපායමාර්ගික ව යොමු කිරීම මඟින් ආර්ථිකයෙහි සඵල ඉල්ලුම ඉහළ නැංවීමත් ඒ දැක්ම තුළ අපේක්ෂිත යි. නිදහසින් පසු අඩු-වැඩි වශයෙන් සහ 1956 න් පසු 1977 තෙක් විශේෂ වශයෙන් රට තුළ ක්‍රියාත්මක වූ මේ ආර්ථික ප්‍රතිපත්ති ධාරාවට අනුකූල බවට නිරීක්ෂණය කළ හැකි අදහස් හා යෝජනා කුමාරතුංග ලේඛනයන් තුළින් ඉස්මතු කර ගත හැකි ය.

(අ) ආයෝජන පිරිමැසුම් හා ඒ මත කෙරෙන පිරිවැයෙහි ජාතික ආර්ථික ප්‍රතිලාභ උපරිම කිරීමේ වැදගත්කම

ආර්ථික අවපාතයක දී තුලිත අය-වැයක් පවත්වාගෙන යාමට යෝජනා කෙරෙන සම්භාව්‍යවාදී පිළිවෙත ඵල රහිත බවත් රාජ්‍ය වියදම් මඟින් ආයෝජනයන් හෝ පරිභෝජනයන් දිරි ගැන්වීම හරහා ජාතික ආර්ථික දේහයේ සඵල ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම අවපාතයෙන් ගොඩ ඒමේ මඟ බවත් කේන්සියානු මතය යි.

එ සේ ම, මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී හා අනුමත කිරීමේ දී ආයෝජන පිරිමැසුම් හා ඒ මත කෙරෙන පිරිවැයෙහි ජාතික ආර්ථික ප්‍රතිලාභ උපරිම කිරීම අත්‍යවශ්‍ය වූවකි. නො එ සේ නම් සිදුවන්නේ රාජ්‍ය සම්පත් මෙන් ම ජාතික සම්පත් ද අපතේ යාමකි - නාස්තියකි. මේ තත්වය උදා වීමට ඇති ඉඩකඩ සූක්ෂ්ම වැ සලකා බැලිය යුතු ය. දේශීය ආර්ථිකයට ඒ ඒ ව්‍යාපෘතීන් ගේ නිමැවුම් මත පමණක් නොව ව්‍යාපෘති මූල්‍යන හා ක්‍රියාත්මක කෙරෙන ක්‍රමවේදයන්ගෙන් පවා උපරිම දායකත්වයක්

ලැබෙන බවට රාජ්‍ය නිලධාරීන් හා සැලසුම්කරුවන් විසින් තහවුරු කරනු ලැබිය යුතු ය. ඊට අදාළ විශ්ලේෂණයන් හා ප්‍රතිලාභ-පිරිවැය ගණන් බැලීම් මනා ලෙස සිදු කළ යුතු ය.

රාජ්‍ය මූල්‍ය තත්වයන්හි ස්ථිරසාර භාවය පවත්වා ගැනීම උදෙසා එ වන් ප්‍රාග්ධන මූල්‍යකරණ විනයක අත්‍යවශ්‍යතාව කුමරතුඟුන් විසින් දැඩි ලෙස අවධාරණය කරනු ලැබ ඇත.

"*ගණන් බැලීමේ අදක්ෂයන් විසින් නිශ්චිත ගණන් අනුවැ ආරම්භ කරන - ආරම්භ කළ නුනුවණ කම නිසා නො නවත්වා කරන්නට සිදු වන - විශාල කටයුතු අපරික්ෂායෙන් ආරම්භ කොට රටේ මුදල් මකාදැමීම මින් ඉදිරියට සිදු නුවුව හොත් රජයේ භාණ්ඩාගාරයෙහි දැනට ඇති ස්ථිරසාර භාවය බොහෝ කලක් මුළුල්ලෙහි එ සේ මැ පවත්වාගැනීම දැන් කළ හැකි බව ද පෙනේ*"

[ලක් මිණි පහන-2479 නිකිණි පුර 7 (1935/08/06),
ලක් මිණි පහන් කතු වැකි, 180 පිට]

අප රටේ ව්‍යාපෘති සම්පාදකයන් විසින් කුමරතුඟුන් ගේ මේ නිර්දේශය පසුගිය කාලය පුරා කෙතෙක් දුරට අනුගමනය කරනු ලැබ ඇත් ද යන්න ගැටලුවකි. විශේෂයෙන්, විදේශ ණය මත කෙරෙන සංවර්ධන ව්‍යාපෘතීන්හි පිරිවැය පිරිමැසුම් හා වියදම් මත දේශීය ආර්ථික සඵල ඉල්ලුම කවර පමණකට ජනනය කර ගැනීමට අප සමත් වී ඇත් ද යන්න විමසා බැලිය යුතු ය.

ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ලා හැකි උපරිම පරිදි සඵල ඉල්ලුම ජනනය වීමට නම් ඒ උදෙසා කෙරෙන අදාළ වියදම් මේ ආර්ථිකය තුළ මැ වැය විය යුතු ය. එහෙත්, මෑත යුගයේ විදේශීය ණය මත විදේශීය සමාගම්වලට දෙනු ලැබූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වෙනුවෙන් කරනු ලැබ ඇති වියදම් බොහොමයක් වැය වී ඇත්තේ අප රට තුළ නොව, ණය දෙන රාජ්‍යයන් තුළ ම ය. ණය දෙන රටේ ආනයන-අපනයන බැංකු මඟින් මූල්‍ය පහසුකම් ලබා දෙනුයේ ඒ රටේ ඉදිකිරීම් සමාගම්වලට පමණි. එ වැනි ණය මත ගොඩනැඟෙන කොන්ත්‍රාත්තු සඳහා තරගකාරී මිල කැඳවුම් නො ගැනෙයි. මේ තත්වය නිසා අවම ආයෝජන පිරිවැය තීරණය නො වන අතර ව්‍යාපෘති පිරිවැය අනවශ්‍ය පරිදි ඉහළ යයි.[3]

[3] උදාහරණ වශයෙන්, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් නාරාහේන්පිට දුම්රිය ස්ථානය සඳහා දේශීය ව ඉදි කෙරුණු විදුලි සංඥා පද්ධතියට වැය වී ඇත්තේ රුපියල් කෝටි එකහමාරක් පමණකි. මෑත දී එ වැනි දුම්රිය ස්ථාන වෙනුවෙන් සංඥා පද්ධති බැහැරින් මිල දී ගැනීම් උදෙසා දුම්රිය ස්ථානයකට රුපියල් කෝටි 30 ක පමණ සාමාන්‍ය පිරිවැයක් දැරීමට දුම්රිය දෙපාර්තමේන්තුවට සිදු වී තිබේ. ඒ අනුව, දුම්රිය සංඥා දෙපාර්තමේන්තුව තුළින් ඉදි කළහොත් එක් දුම්රිය ස්ථානයකට රුපියල් කෝටි 28.5 ක් ඉතිරි කර ගත හැකි බව 2018 වසරේ දී ප්‍රවාහනය හා කාර්යෝපාය පිළිබඳ ශ්‍රී ලංකා සංගමය විසින් පැවැත්වුණු R4TLI-2018 සමුළුවට ඉදිරිපත් කෙරුණු පර්යේෂණ වාර්තාවකින් අනාවරණය වෙයි. (Jayasundara, 2018). තව ද, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඉතා මෑත දී පොල්ගහවෙල-කුරුණෑගල විදුලි සංඥා පද්ධතිය ඉදි කිරීමේ දී පොතුහැර දුම්රිය ස්ථානය වෙනුවෙන් වැය වී ඇත්තේ රුපියල් කෝටි දෙකහමාරක් පමණක් වීම තුළින් ද මේ තත්වය තව දුරටත් තහවුරු කෙරෙයි.

ණය ප්‍රමාණය තීරණය වන්නේ ද ඒ අනුව ය. ඒ ණය ප්‍රමාණය ද ශ්‍රී ලංකා රජයට මුදල් වශයෙන් නො ලැබෙයි. අපට ලැබෙනුයේ රට අසවල් පමණකට ණය වූයේ ය යන ගිණුම් සටහන පමණි. ණය ප්‍රමාණය විදේශ මුදලින් ම විදේශයන්හි දී ම ඒ රටේ ආනයන-අපනයන බැංකු විසින් ඒ රටේ ම ඉදිකිරීම් සමාගම්වලට ගෙවනු ලැබෙයි. අප රට තුළ වියදම් කෙරෙනුයේ ශ්‍රමිකයන්ට ගෙවෙන වේතන හා දේශීය ව මිල දී ගැනෙන යම් යම් සීමිත යෙදවුම් සඳහා කෙරෙන ගෙවීම් පමණි. ඒ කොටස සමස්ත ව්‍යාපෘති පිරිවැයෙන් හා අදාළ ණය මුදලින් ඉතා සුළු කොටසකි.

මේ ක්‍රමය ක්‍රියාත්මක වීම නිසා පසුගිය කාලයක් පුරාවට අප රට තුළ කෙරුණු මහා පරිමාණ යටිතල පහසුකම් ඉදිකිරීම් උදෙසා ගැනුණු ණය මත සඵල ඉල්ලුම ජනනය වී ඇත්තේ විදේශ ආර්ථිකයන්හි ය. ඉන් දිරි ගැන්වුණේ අපගේ ව්‍යවසායකයන් නොව විදේශ සමාගම් ය.

(ආ) ආනයන ආදේශනයේ වැදගත්කම

ඉහතින් ද නිරීක්ෂණය කෙරෙන අයුරු රාජ්‍ය මැදිහත්කරණවාදී සංවර්ධන යොමුව සැබෑ ලෙස ම ප්‍රගතිශීලී වීමට නම් දේශීයත්වයට ප්‍රමුඛස්ථානයක් ලැබෙන හා විදේශයන් මත යැපීම අවම කෙරෙන දිශානතියක් ද කේන්සියානු සඵල ඉල්ලුම් න්‍යායයට සමගාමී ව ක්‍රියාත්මක විය යුතු ය. රට තුළ රාජ්‍ය මැදිහත්වීමෙන් ඇති කෙරෙන අමතර වෙළෙඳ පොළ ඉල්ලුමෙන් දිරි ගන්වනු ලැබිය යුත්තේ දේශීය නිෂ්පාදකයා පමණකි. ඇති කෙරෙන අමතර ඉල්ලුමට සැපයුම ලබා දීමේ අවස්ථාව විදේශීය නිෂ්පාදකයාට විවර වෙතොත් රටේ පොදු මහජනතාවගේ අනාගතය පරදුවට තබමින් රාජ්‍ය අය-වැය හිඟයක් දරා උදා කර ගන්නා සඵල ඉල්ලුම ජාතික වශයෙන් නිෂ්ඵල වීම වැළැක්විය නොහැකි ය.

ආනයන ආදේශනවාදී හා ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ධාරාවක් ඔස්සේ දේශීය වෙළෙඳ පොළ, දේශීය කර්මාන්තකරුවා හා ගොවියා දිරි ගැන්වීම උදෙසා යොදා ගත යුතු බව කුමරතුඟුවෝ පැවැසූ හ.

*"පිට රටින් ලැබෙන තෙලින් අපි උයමු පිසමු නම්, පහන් දල්වමු නම්, පිට රටින් ලැබෙන සබන් අපි ඇඟ ගාමු නම්, පිට රටින් ලැබෙන ඉටි පහනින් එළිය ලබමු නම්, අපේ පොල් තෙල් නොවිකිණීම පුදුමයෙක් ද?"*

[ලක් මිණි පහන -2478 පොසොන් අව 15 (1934/07/10),
ලක් මිණි පහන් කතු වැකි, 7 පිටුව]

වර්තමානයේ ද අන්ධානුකරණයෙන් මෙන් අදහන නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය නිසා ස්වදේශික කර්මාන්ත සංවර්ධනයට වැදී ඇති පහර කුමාරතුංගයන් මනා වැ වටහා ගෙන තිබිණි. රට තුළ කර්මාන්ත-පාදක නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනඟා ගනිමින් අපට ඇවැසි දෑ හැකි උපරිම මට්ටමට රට තුළ මැ නිපයා ගැනීමේ වැදගත්කම සහ ඒ උදෙසා ආනයන මත රඳා පැවැත්ම අඩු කෙරෙන උපාය මාර්ගයට ප්‍රවිෂ්ට විය යුතු බව අවධාරණය කෙරුණේ ඒ නිසා විය යුතු ය.

*"...පිටරටින් ගෙනෙන තෙල් වර්ගවලට මහත් කරයෙකින්[4] පහර දෙනු ....පොලින් කළ හැකි තාක් කර්මාන්ත කරන්නට පටන් ගනු. ඒ කර්මාන්තවලට හරස් වන දැයට තෙලට දුන් පහර මැ දෙනු. මුදල් නැත් නම් රජයේ පිහිට ලබනු"*

[ලක් මිණි පහන -2478 පොසොන් අව 15 (1934/07/10),
ලක් මිණි පහන් කතු වැකි, 6 පිටුව]

උක්ත උද්ධෘත මගින් කුමරතුඟුන් විසින් ජාතිය හමුවේ ඉදිරිපත් කරනු ලැබ ඇති ආර්ථික දර්ශනය මනා ව පිළිබිඹු වෙයි. ජාතික ආර්ථිකය දේශීය නිෂ්පාදන අඩිතාලමක් මත අවම ආනයන සූක්ෂ්මතාවක් සහිත ව පවත්වාගෙන යා යුතු බව ඉන් දැක්වෙන දිශානතිය යි.

ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ගැටලු බොහොමයකට හේතුවක් වන්නේ මෙම දැක්ම අනුගමනය නො කිරීමේ හා ආනයන මත අධික ව රඳා පැවැතීමේ ප්‍රවණතාව යි. එහි ප්‍රතිවිපාක ලෙස ජංගම ගිණුමේ හිඟය, උද්ධමනය, රුපියලේ අගය අව-ප්‍රමාණය වීම ආදි වශයෙන් ගැටලු ගණනාවක් ඉස්මතු වී ඇති බව පසුගිය දශක කීපය තුළ ලැබූ අත්දැකීම් අනුව ඉතා පැහැදිලි ය.

(ඇ) උපරිව්‍යූහ සංවර්ධනය උදෙසා රජය මැදිහත් වීමේ අවශ්‍යතාව

සංවර්ධනයෙහි ලා පූර්ව අවශ්‍යතාවක් වන යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා රජය මැදිහත් වීමේ වැදගත්කම කුමාරතුංගයෝ අවධාරණය කරති. ඒ බව පහත උද්ධෘතයෙන් පැහැදිලි වෙයි:

*"ජල විදුලිය නිපැදැවීමේ ප්‍රශ්නය මේ වරත් අඳුරෙහි තැන් පත් වීම ගැනැ ද රටේ දොම්නසෙකි. මේ ක්‍රියා මාර්ගය සඵල වී නම් රජයටත් රට වැසියනටත් සිදු වියැ හැකි මහත් ලාභය ප්‍රත්‍යක්ෂ වැ පෙනෙද්දී ද මැති සබය දක්වන උදාසීන භාවය සැබැවින් මැ සංවේග දායක යැ"*

[ලක් මිණි පහන -2479 නිකිණි පුර 7 (1935/08/06),
ලක් මිණි පහන් කතු වැකි, 181 පිටුව]

යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙන් ඇති විය හැකි අර්ථ ලාභයන් පෙනෙද්දී පවා ඒ උදෙසා රජය උනන්දු නොවීම කුමාරතුංගයන් ගේ මැසිවිල්ලට හේතු පාදක වෙයි. වෙළෙඳ පොළ ඉල්ලුම හා සැපයුම අනුව ආයෝජන මට්ටම් තීරණය කෙරෙන සම්භාව්‍යවාදී හෝ නව සම්භාව්‍යවාදී හෝ ප්‍රතිපත්ති දිශානතීන්ට වඩා මෙම දැක්ම ආයෝජනයේ බහිර්ජන්‍යත්වය (Exogeneity) මත පදනම් වූ රාජ්‍ය මැදිහත්කරණවාදී කේන්සියානු ආකෘතියට සමීපත්වයක් පෙන්වයි.

[4] ලක්මිණි පහන් කතු වැකි කර්තෘ සඳහන් කරන පරිදි "කරය" යනු "අය බද්ද" යි (ලක්මිණි පහන් කතු වැකි, 7 පිටුව). ආයාත පිළිබඳ ව යෙදෙන විට මින් "තීරු බද්ද" ගම්‍ය කෙරෙන බව නිරීක්ෂණය වෙයි.

***සමානාත්මතාවාදී - සමාජවාදී - අධිරාජ්‍ය විරෝධී - ආර්ථික ප්‍රතිපත්ති නැඹුරුව***

කුමරතුඟුන් ගේ නිර්මාණයන් ජනිත වූ කාල වකවානුව ලෝකය පුරා ම අධිරාජ්‍ය විරෝධී සමාජ- දේශපාලන ප්‍රවණතා ඉස්මතු වූ යුගයකි. සුප්‍රසිද්ධ රුසියානු විප්ලවයේ ආස්වාදය මෙන් ම වරප්‍රසාද ලත් ප්‍රාග්ධන හිමියන් විසින් වැඩ කරන පීඩිත පන්තිය සූරා කෑම පිළිබඳ ව දේශපාලන ඉගැන්වීම් සහ ඊට එරෙහිව කළ යුතු පන්ති අරගල පිළිබඳ ආකල්ප ශ්‍රී ලංකාවේ ද ශීඝ්‍රයෙන් පැතිර යන්නේ මේ අවදියේ ය. සූරා කෑම හෙළා දකින හා සමානාත්මතාව අගය කරන දැක්මක් තම ජාතිකවාදී පදනම මත ම ගොඩ නඟාගෙන තිබූ බව පෙනෙන කුමාරතුංගයන් ගේ සමකාලීන ලේඛන තුළින් සමාජවාදී දේශපාලන- ආර්ථික දිශානතියක හැඩ-රුව දිස් වීම ඒ අනුව අරුමයක් විය නොහැකි ය.

(i) ආදායම් ව්‍යාප්තියේ විෂමතාව අඩු කිරීම හා ආර්ථික සමානාත්මතාව තහවුරු කිරීම

සමානාත්මතාව මූලික බෞද්ධ ඉගැන්වීමෙකි. ඇති-නැති පරතරය සහමුලින් නැති කළ හැකි බවක් බෞද්ධ ආර්ථික විග්‍රහයන්හි නොකියැවෙන නමුදු ඒ පරතරය හැකි පමණ අවම කළ යුතු බවත්, සමාජ ස්වස්ථතාව හා සාමය තිරසර කළ හැක්කේ ආර්ථික අසමානතා හැකි අවම මට්ටමකට අඩු කිරීමෙන් බවත් එහි සඳහන් වේ. මාක්ස්වාදී හා සමාජවාදී දේශපාලන-ආර්ථික දැක්ම එම පරතරය සහමුලින් ඉවත් කොට කම්කරු පන්තිය විසින් නිෂ්පාදන සාධකවල අයිතිය හිමි කරගන්නා සමාජයක් නිර්මාණය කිරීම අරමුණු කර ගනියි.

සංවර්ධනාභිමුඛ වීමේ දී ආදායම් විෂමතාවක් ඇති වීම සාමාන්‍යකරණය කෙරෙන නව ලිබරල්වාදී දෘෂ්ටිවාදයට මේ චින්තන ධාරා දෙක ම පටහැණි වෙයි. සිය ලේඛන මඟින් සමාජ-ආර්ථික විෂමතා අවම කිරීමේ අවශ්‍යතාව කුමාරතුංගයන් විසින් අවධාරණය කෙරෙනුයේ මේ සන්දර්භයන්හි දී ය.

"*රටේ ඉතා අධික පක්ෂය වන දුප්පත් ජනයා ගේ දෛනික ප්‍රයෝජනයට අත්‍යවශ්‍යක වූ ආහාර ද්‍රව්‍යයන් ලාභ කිරීම සඳහා විශේෂයෙන් යම් කිසි ස්ථිර ප්‍රතිපත්තියක් ඉදිරිපත් නොකිරීම එක් පාඩුවෙකි* "

[ලක් මිණි පහන -2479 නිකිණි පුර 7 (1935/08/06),
ලක් මිණි පහන් කතු වැකි, 180 පිටුව]

ප්‍රධාන ප්‍රවාහ ආර්ථික චින්තනය අනුව කෙරෙන ආදායම් වෘද්ධියේ ඇති වන ප්‍රධානතම ගැටලුවක් වන්නේ ආදායම් ව්‍යාප්තියේ ඇතිවන මේ විෂමතාව යි. සමාජ ආර්ථික අර්බුද ගණනාවකට මඟ පාදන ඒ චින්තන ධාරාවට විකල්ප වූ සමානාත්මවාදී දැක්මක් කුමාරතුංගයන් විසින් නිර්දේශ කෙරෙන බව ඒ නයින් පැහැදිලි වෙයි.

(ii) ඉහළට ප්‍රතිලාභ ගලන ආර්ථික ආවරණයක් සහිත ජන සහභාගිත්ව ආර්ථික ක්‍රමයක්

ආර්ථික ප්‍රතිලාභ පහළට කාන්දු වීමේ ආවරණය (Trickle-down Effect) හා ඉහළට ගලා ඒමේ ආවරණය (Trickle-up Effect) සංවර්ධන ආර්ථික විද්‍යාව තුළ විමර්ශනයට බඳුන් වන ආර්ථික න්‍යායයන් දෙකකි.

නව සම්භාව්‍යවාදී ආර්ථික දැක්ම තුළ අපේක්ෂා කෙරෙනුයේ පළමු ව වෘද්ධිය හා ඉන් අනතුරු ව ඵලය බෙදී යාම යි. වෙනත් අයුරකින් පැවසෙන්නේ නම්, ධනවතුන් හා ව්‍යාපාර දිරිමත් කිරීම තුළින් ආයෝජන උත්තේජනය කිරීම හරහා ආර්ථික වෘද්ධිය ජනනය වෙන බව හා ඒ මඟින් දිගු කාලීන ව සමාජයට විශාල වශයෙන් ප්‍රතිලාභ සැලසෙන බව පැවසෙන පහළට කාන්දු වීමේ ආවරණය යි. ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල වර්තමාන සංවර්ධන ප්‍රතිපත්ති පදනම් වී ඇත්තේ මෙම පහළට කාන්දු වීමේ ආවරණය අරමුණු කරගෙන බව පෙනේ.

මෙම මාවතෙහි එක් නො වැළැක්විය හැකි ප්‍රතිවිපාකයක් වන්නේ අවම වශයෙන් කෙටි කාලයකට හෝ (දිගු කාලීන ව ඒ තත්වය සමනය වීම ද විවාදාපන්න මාතෘකාවකි) බරපතළ ආදායම් විෂමතාවන්ට මුහුණ පෑමට අදාළ සමාජ-ආර්ථිකයට සිදු වීම යි.

මීට විකල්ප වශයෙන් ඉදිරිපත් කෙරෙන ඉහළට ගලන ආවරණයේ දී අපේක්ෂා කෙරෙනුයේ පහළ හා මධ්‍යම පන්තියට ඍජු ව ම ප්‍රතිලාභ ලබා දෙන ප්‍රතිපත්ති හරහා සමස්ත සමාජයේ ම ඵලදායිතාව සහ ආර්ථික ශක්‍යතාව ඉහළ නැංවිය හැකි බව යි. ඒ උපාය මාර්ගය ඔස්සේ ගමන් කරන්නේ නම් සමාජ විෂමතා අවම කෙරෙන අතර සියලු ස්තරවල සුභසාධනය ද ඉහළ මට්ටමක පවත්වා ගත හැකි වෙයි.

රටේ බහුතරය වූ පීඩිත පන්තියේ "පොදු ජනයා" සවිමත් කිරීමෙන් සමස්ත ආර්ථිකය ම දියුණු කළ හැකි බවට වූ මෙම උපායමාර්ගික දැක්ම කුමාරතුංග කෘතිවලින් විද්‍යමාන වෙයි. නිදසුන් ලෙස, හීන් සැරයෙන්[5] අලි හාමිලා ගේ පයට පෑගෙන ජනතාව ගේ ශක්තිය නිරූපණය කෙරෙන බව හරිශ්චන්ද්‍ර විජයතුංගයෝ පවසති (විජයතුංග, 2001, 7 පිටුව). කුමාරතුංගයන් ජාතිකවාදී වන අතරේ ම සමාජ-ප්‍රජාතාන්ත්‍රික වූ ජන සහභාගිත්ව අර්ථ ක්‍රමයක් අගය කළ බව මින් පෙනී යයි.[6]

"*රටෙහි මුදල් හිඟය නොවෙනස් වී යැ. මුදල් හිමියන් ළඟැ මැ නැවැතී සිටී....රජයේ මුදල් දෙන ක්‍රමයක් වෙයි. ඒ පොහොසතුනට වැඩ සඳහා යැ. බැහැරැ මුදල් ණයට දෙන්නෝ ද වෙති. ඔහු ද පොහොසතුනට මෙහෙ කරති. ඉතින් අද රුපියෙලකැ උපකාරයක් ලබා ගත හැකි නම්, මාසය අගැ දී රුපියල් දහයක් ණය වීමෙන් වැළැකියැ හැකි අසරණයාට, අහෝ, කවර දෙවියන් ගේ පිහිට ද? දෙවියෝ පොහොසතුන් දෙස මැ බලති.* "

[ලක් මිණී පහන -2478 උඳුවප් අව 12 (1935/01/01),
ලක් මිණී පහන් කතු වැකි, 90/91 පිටු]

---

[5] කුමාරතුංග (1934). හීන් සැරය, කොළඹ: පහන් පහර [කුමාරතුංග (සංස්.).(2004). 460 පිටුව].

[6] කුමරතුඟුන් ගේ ස්වදේශිකවාදී සමාජවාදය බටහිර ගැත්තන්ට හා ධනපතීන්ට විරුද්ධ බවත්, එය පියදාස සිරිසේනයන් ගේ ජාතිකවාදී නමුදු මධ්‍යම පාන්තිකයන් ඉහළට එසැවීම ඉලක්ක කරගත් ධනවාදී නැඹුරුවෙන් බැහැර වූ බවත්, හරිශ්චන්ද්‍ර විජයතුංගයෝ සිතති. ඔවුන් දක්වන පරිදි අප රටේ සමාජවාදී අරගලය බටහිර ආභාසය ලැබූ මධ්‍යම පාන්තික කළු සුද්දන් ගේ වරප්‍රසාද තර කිරීමේ සටනකි. සටන මොට වී ගියේ එය පීඩිත පන්තියේ අරගලයක් නොවූ බැවිනි (විජයතුංග, 2001, 5 වැනි පිටුව).

ගොවියාට ඉහළ ආදායම් මට්ටමක් ලැබෙන පරිදි සැකැසුණු ජපන් කෘෂි ප්‍රතිපත්තිය ඔස්සේ තහවුරු කර ගන්නා ලද සමාජ ස්ථාවරත්වය සහ කාර්මික සාමය ඉතා කාර්යක්ෂම හා ලොව දිනිය හැකි ඉහළ තාක්ෂණයෙන් යුතු කර්මාන්ත ක්ෂේත්‍රයක් ගොඩ නඟා ගැනීමට ඒ රටට උපස්තම්භක වූ අයුරු මීට නිදසුන් සපයයි. (OECD, 2009) ගඩාෆි පාලන කාලයේ දී ශීඝ්‍රයෙන් සංවර්ධනය වූ ලිබියාවේ ප්‍රතිපත්ති දැක්මෙහි ද මේ පහළ සිට ඉහළට ගලන ප්‍රතිලාභ ප්‍රවාහ අපේක්ෂාව ගැබ් වැ තිබූ බව අනුමාන කළ හැකි ය (John, 2008).[7] එහෙත්, කුමාරතුංගයන් ගේ ඒ දැක්ම අප රටේ ආර්ථික ප්‍රතිපත්ති හැඩගැස්වීමෙහි ලා ප්‍රමාණවත් වැ උපයෝජනය නොවීම අවාසනාවකි.

(iii) භාණ්ඩ නිෂ්පාදනය සේවාවන්ට ඉහළින් තැබීම

නූතන මූලප්‍රවාහ අර්ථ ශාස්ත්‍රීය ඉගැන්වීම් තුළ නිෂ්පාදන වර්ගයන් අතර වැදගත්කමෙහි ක්ෂේත්‍රීය වෙනසක් නොමැත. එහෙත්, සෝවියට් ආකෘතියේ සමාජවාදී ආර්ථික දැක්මෙහි දී සේවා අංශයට වඩා ඉහළ වැදගත්කමක් කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන ක්ෂේත්‍රයන්ට හිමි වෙයි. වෙළෙඳ සේවා, ප්‍රචාරණ සේවා, මූල්‍ය සේවා හා අතරමැදි හුවමාරු ගනුදෙනු වැනි සේවාවන්ට ලැබෙන වෙළෙඳ පොළ වටිනාකම තුළ සමපේක්ෂණය ගැබ් වී තිබීම මීට පාදක වූ සාධකයක් විය හැකි ය. සමාජවාදී රටවල් විසින් දළ දේශීය නිෂ්පාදිතය වෙනුවට *ශුද්ධ ද්‍රව්‍යමය නිෂ්පාදිතය* (Net Material Product) නමැති දර්ශකය[8] යොදා ගැනුණේ එ බැවිනි (Tatian, 2006). සේවාවලට ඉහළින් භාණ්ඩ නිෂ්පාදනය උසස් කොට සැලැකීමට අගය කිරීමට කුමාරතුංගයන් පෙලැඹුණේ මේ සමාජවාදී දැක්මෙහි ආභාසය නිසා විය හැකි ය.

"*පුරාණයෙහි ඉතා උසස් තනතුරෙහි සිටියෝ ද කර්මාන්තයට සුදුසු ගෞරවය කළෝ යැ..... කර්මාන්තය සේවාවට වඩා උසස් කොටැ සැලැකීම පුරුදු කළ යුත්තේ යැ..*"
(කුමාරතුංග මුනිදාස පදනම, 2015, ප්‍රබන්ධ සංග්‍රහය, 170 සහ 172 පිටු)

එහෙත්, වර්තමාන ශ්‍රී ලාංකේය ආර්ථිකය රැගෙන ඇත්තේ ඉන් පරිබාහිර මඟක් බවත්, දළ දේශීය නිෂ්පාදිතයට වැඩිපුර දායකත්වය ලබා දෙන්නේ කාර්මික අංශයෙන් නොව සේවා අංශයෙන් බවත් ජන ලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත තුළින්

---

[7] ජනාධිපති ගඩාෆිගේ "ආර්ථික ගැටලුවේ විසඳුම" යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ (හරිත පොතේ) II කොටසේ සමාජවාදය සඳහා ලිබියානු ප්‍රවේශය පැහැදිලි කර ඇත. ඒ මත පදනම් ව 70 දශකයේ දෙවන භාගයේ දී ධනය හා සම්පත් යළි බෙදා හැරීම සඳහා පියවර ගණනාවක් ගඩාෆි රජය විසින් ගන්නා ලදි. උදාහරණ ලෙස නිවාස, ප්‍රාග්ධනය සහ ඉඩම්වල ධනය සැලකිය යුතු ලෙස යළි බෙදාහැරීම, පෞද්ගලික ව්‍යවසායයන් මුළුමනින් ම පාහේ තුරන් කිරීම වැනි පියවර දැක්විය හැකි ය.

[8] ද්‍රව්‍යමය නිෂ්පාදන පද්ධතියේ සංකල්පය මත පදනම් ව සෝවියට් සමූහාණ්ඩුවේ ආර්ථික වර්ධනය මිනුමට භාවිත වූ දර්ශකයක් වන ශුද්ධ ද්‍රව්‍යමය නිෂ්පාදිතය (NMP) තුළ ද්‍රව්‍යමය නිෂ්පාදිත සහ ද්‍රව්‍යමය සේවා ඇතුළත් විය. සෞඛ්‍යය, අධ්‍යාපනය යනාදිය ද්‍රව්‍යමය නොවන සේවා ලෙස සැලැකිණි.

පිළිබිඹු කෙරෙයි.[9] ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන මේ ප්‍රවණතාව කර්මාන්තයන්ට වඩා උසස් ස්ථානයක් සේවාවන්ට හිමි වීම සුදුසු නො වන බව අවධාරණය කෙරෙන කුමාරතුංගයන් ගේ දැක්මට පටහැණි වෙයි.

(iv) පොදු දේපොළ අයිතිය

කුමාරතුංගයන් ගේ ලේඛනයන්හි ඉස්මතු වී පෙනෙන තවත් එක් මාක්ස්වාදී නැඹුරුවක් වන්නේ එතුමන් පොදු දේපොළ අයිතිය වෙනුවෙන් පෙනී සිටීම යි. පෞද්ගලික අයිතියේ නාමයෙන් අකටයුතු, අසාධාරණකම්, ලේ හැළීම්, මිනී මැරීම්, යුද්ධ, සොරකම් මංකොල්ල කෑම් ආදිය සිදු කෙරෙන බව එතුමෝ දකිති. එ වක අධිරාජ්‍ය විරෝධී සටනට සහභාගී වූ ජාතිකවාදී බොහෝ දෙනාට වුවමනා වූයේ මධ්‍යම පාන්තික විප්ලවයක් විනා පීඩිතයන් ගේ සමාජ විප්ලවයක් නො වූ අතර, එකකු ගේ ශ්‍රමය අනෙකකු විසින් ගසා කෑම සහ ඊට පදනම් වූ පෞද්ගලික දේපොළ අයිතිය වෙනස් කිරීමක් ඔවුන් ගේ අරමුණු අතර නො වී ය. කුමරතුංගුවෝ එ වැන්නන් ගේ සටන් සීමාවෙන් ඔබ්බෙහි වූ පොදු අයිතිය වෙනුවෙන් සටන් කළ හ.

ඇති නැති කවුරුත් සහෝදරත්වයෙන් බැඳී බෙදා හදා ගන්නා සමාජයක් වෙනුවෙන් වූ සමාජවාදයක් කුමරතුඟු දැක්මේ තිබූ බව පහත කව නිදසුන් ලෙස ගෙන හැර දක්වමින් හරිශ්චන්ද්‍ර විජයතුංගයෝ පවසති (විජයතුංග, 2001, 32 පිටුව) :

*කා නැතියනට ද ඇති ලෙසකට දී*
*මේ ලොවැ සැප විඳු එ ලොව නො වර දී*
*යා යුතු මෙ මඟැ යැ බලත නැණැ යෙදී*
*පාරට වැටෙමී යි නො යව වල් වැදී*

(හෙළ මීයැසිය)

***නව සම්භාව්‍යවාදී රාමුව තුළ පිහිටුවනු ලැබිය හැකි නිර්දේශ***

කුමාරතුංග ආර්ථික දැක්ම එතුමා ගේ කෘතීන් තුළින් හඳුනා ගැනීමට යත්න දැරෙන විට නූතන මූලප්‍රවාහ නව සම්භාව්‍යවාදයට නෑකම් කිව හැකි දිශානතීන් සුලබ ව සපයා ගත හැකි නොවන බව මෙම විමසුමෙහි එක් මූලික නිරීක්ෂණයකි. කෙ සේ වුව ද, රාජ්‍ය මූල්‍යනය පිළිබඳ ව කරනු ලැබ ඇති යම් යම් ප්‍රකාශයන් නව සම්භාව්‍යවාදයට පටහැණි නොවන බව ද හඳුනා ගත හැකි ය.

නව සම්භාව්‍ය වාදය පදනම් වන්නේ වෙළෙඳ පොළ ක්‍රියාකාරීත්වය මත යි. වෙළෙඳ පොළ යන්ත්‍රණය නිසි පරිදි කාර්යක්ෂම ව ක්‍රියාත්මක වීම මෙහි ලා අත්‍යවශ්‍ය සාධකයකි. රාජ්‍ය මැදිහත්කරණය නව සම්භාව්‍යවාදී ආර්ථික න්‍යායෙහි හෝ ඒ මත ගොඩනැඟුණු

[9] ජන ලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 2018 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකා ආර්ථිකයේ කර්මාන්ත අංශය 29.1% ක් ද සේවා අංශය 61.2% ක් ද වී ඇත.

නව ලිබරල්වාදී දේශපාලන දැක්මෙහි හෝ නිර්දේශ නො වුණ ද, වෙළෙඳ පොළ යන්ත්‍රණයේ සුමට ක්‍රියාකාරිත්වයට ඇති බාධක ඉවත් කිරීම උදෙසා මැදිහත් වීම රජයේ වගකීමක් ලෙස එහි ලා සැලැකෙයි. වෙළෙඳ පොළට අවශ්‍ය නිෂ්පාදන සාධක ප්‍රවර්ධනය කිරීම ඔස්සේ හා ඒ අරමුණ ඉදිරියේ ඇති බාධක ඉවත් කිරීම ඔස්සේ සංවර්ධනාභිලාෂී වීම ඒ අනුව නව සම්භාව්‍යවාදී දැක්මට පටහැණි නැත.

(අ) ශ්‍රම සම්පත කුළු ගැන්වීම සහ යහපාලනය

කුමාරතුංග මුනිදාසයෝ රටක සංවර්ධනයෙහි ලා රාජ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ව වරෙක මෙසේ සඳහන් කළහ:

"*අතුට අනුශාසකයන් විසින් කළ යුත්තේ මිනිසුන් ගේ ශක්තිය වර්ධනයට මං සැලැස්වීම යි. ශක්තිය ද්විවිධ යැ, කායික යැ, මානසික යැ යි. මේ දෙක නිසා උපදනා වූ ශීල ශක්තියෙකුදු වෙයි. සමාජයෙහි ලා සංහති ශක්තියෙකුදු ලැබෙයි.*"

[ලක් මිණි පහන -2478 මැදින් පුර 9 (1935/03/12),
ලක් මිණි පහන් කතු වැකි, 115/116 පිටු]

නිෂ්පාදන සාධකයක් වූ ශ්‍රමය කුළු ගැන්වීමට රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයන් කටයුතු කළ යුතු බව මින් පැවැසෙයි. ශ්‍රම ඵලදායිතාවට පාදක විය හැකි (නව සම්භාව්‍යවාදයේ දක්නට නොලැබෙන) මනුෂ්‍ය ශක්තීන් තුනක් හා සාමූහික සමාජීය ශක්තියක් එතුමා විසින් හඳුනා ගනු ලැබ ඇත.

ශීල ශක්තිය මෙහි ලා නවමු අදහසක් ලෙස අර්ථ ශාස්ත්‍රීය න්‍යාය පද්ධතියට එකතු විය යුතු බව පෙනී යන්නේ ඒ ඔස්සේ ගොඩනැඟෙන සදාචාරවත් හා විනය ගරුක ශ්‍රමිකයා ආර්ථික නාස්තියට, දූෂණයට හෝ සමාජ විරෝධී ක්‍රියාවන්ට යොමු වීම වැළැක්වෙනුයේ නෛතික බලපෑමෙන් නොව ස්වායත්ත ආභ්‍යන්තරික පෙලැඹවීම මඟින් බැවිනි. අභිවෘද්ධියට හේතු වන බවට බෞද්ධ ඉගැන්වීමේ එන සීල සම්පදාව මෙ සේ කුමාරතුංගයන් විසින් අර්ථ ශාස්ත්‍රානුකූල ව ශ්‍රම කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ සාධකයක් ලෙස භාවිත කරනු ලැබ ඇති බව නිරීක්ෂණය වේ.

වර්තමාන ආර්ථික විද්‍යා සංකල්ප ඇසුරින් මෙය විග්‍රහ කළ හොත් සරල ව ම විද්‍යමාන වන්නේ රාජ්‍ය මූල්‍යකරණයේ මූලිකාංග ලෙස හඳුනා ගනු ලැබිය හැකි වග වීම (Accountability), කාර්යක්ෂමතාව (Efficiency), ප්‍රමුඛතාව (Prioritization) සහ සම්පත් ඵලදායී ලෙස වෙන් කිරීම (Efficient allocation of resources) වැනි යහපාලන අවශ්‍යතාවන් සහ එහි ලා ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ කාර්යභාරයේ වැදගත්කම අවධාරණය කරනු ලැබ ඇති බව යි.

ප්‍රජාතාන්ත්‍රීය රාජ්‍ය ක්‍රමය ද කුමාරතුංගයන් විසින් අගය කරනු ලැබ ඇති බව එතුමා ගේ ලේඛනවලින් ගම්‍ය වේ. ප්‍රජාතන්ත්‍රවාදය යහපාලනයේ එක් මූලධර්මයකි. නව ලිබරල්වාදී දේශපාලන ආර්ථික දැක්ම අවම වශයෙන් ප්‍රකාශිත ව හෝ ප්‍රජාතාන්ත්‍රික පාලන ක්‍රමයකට අනුගත වෙයි. රජය මහජන අවශ්‍යතා අනුව කටයුතු කිරීම වැදගත් වන

බවට කුමාරතුංගයන් විසින් කෙරුණු ප්‍රකාශයන් ඒ අනුව නව ලිබරල් දැක්මට පටහැණි නො වෙයි.

*"රට සුව පත් වන්නට නම් පොහොසත් බව ඇති වියැ යුතු යැ. පොහොසත් බව ඇති වන්නට නම් රටෙහි නිදහස ඇති විය යුතු යැ. නිදහස ඇති වන්නට නම් මහාජනයාට වුව මනා පරිදි රජය කළ යුතු යැ."*

[ලක් මිණි පහන -2478 බිනර පුර 3 (1934/09/11),
ලක් මිණි පහන් කතු වැකි, 32 පිටුව]

කෙ සේ වුව ද, අධිරාජ්‍යවාදී පාලන සමයේ රාජ්‍ය යන්ත්‍රණය පිළිබඳ ව කෙරුණු මෙම කුමාරතුංග ප්‍රකාශය පසුබිමේ සහභාගිත්ව පාලනයක අවශ්‍යතාව පමණක් නොව බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයෙන් මිදීමේ නිදහස් අරගලයේ න්‍යාය පත්‍රය ද තිබුණු බවට සැක නැත.

(ආ) නවෝත්පාදන, පර්යේෂණ සහ සංවර්ධනය

නව සම්භාව්‍යවාදයෙහි ලා නිෂ්පාදන සාධකවල ඵලදායීතාව මැනෙනුයේ නිෂ්පාදන ශ්‍රිතය තුළ සාධකවලට අදාළ සංගුණකයන් ඔස්සේ ය. අභ්‍යන්තරීකෘත (Embodied) තාක්ෂණික සංවර්ධනයක දී මෙම සංගුණක අගයයන් ඉහළ යන අතර බහිර්කෘත (Disembodied) ආකෘතියේ දී තාක්ෂණ පරාමිතිය වෙන ම නිෂ්පාදන සාධකයක් ලෙස සලකනු ලැබිය හැකි ය. මේ කවරාකාරයෙන් වුව ද, ආර්ථික වෘද්ධිය උදෙසා තාක්ෂණයෙන් ලැබෙන දායකත්වය නූතන ආර්ථික න්‍යායාත්මක ආකෘතීන්හි මනා ව පිළිගැනීමට ලක් වී ඇත.

ආර්ථික සංවර්ධනය උදෙසා තාක්ෂණයේ ඇති වැදගත්කම හා ඊට පාදක වන නවෝත්පාදන හා පර්යේෂණ සිදු නොකරන රටකට අනාගත සංවර්ධනයක් තිබිය නොහැකි බව කුමාරතුංගයන් විසින් දකිනු ලැබ ඇත්තේ දශක අටකටත් ඉහත දී ය. විරිත් වැකියෙහි ඔහු සඳහන් කරන පහත පැදියෙන් ඒ බව ස්ඵුට වෙයි:

*අලුත් අලුත් දෑ නො තනන*
*ජාතිය ලොවැ නො නඟී*
*හිඟා කෑම බැරි වුණු තැන*
*ලගී ගයා මර ගී*

(විරිත් වැකිය)

එ වැනි සාහිත්‍යමය පසුබිමක් සහිත ශ්‍රී ලාංකික ආර්ථික දේහය තුළ නවෝත්පාදන - පර්යේෂණ හා තාක්ෂණික ප්‍රවර්ධන කටයුතු වෙත දක්වනු ලැබ ඇති අවධානය ප්‍රමාණවත් නොවීම ගැටලුවකි.

තෝරාගත් ආසියාතික රටවල් කිහිපයක් විසින් 2015 වසරේ දී වැය කෙරුණු පර්යේෂණ හා සංවර්ධන වියදම් අනුපාතික සංසන්දනාත්මක ව ඉදිරිපත් කෙරෙන 1 වැනි වගුවේ දත්ත තුළින් ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන මෙම තත්වය ඉතා පැහැදිලි ලෙස පිළිබිඹු වෙයි.

වගුව - 1 : තෝරාගත් ආසියාතික රටවල් කිහිපයක පර්යේෂණ හා සංවර්ධන වියදම් අනුපාතික - 2015

| රට | පර්යේෂණ හා සංවර්ධන වියදම් (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස) |
|---|---|
| දකුණු කොරියාව | 4.2% |
| සිංගප්පූරුව | 2.3% |
| මැලේසියාව | 1.3% |
| හොංකොං | 0.8% |
| ඉන්දියාව | 0.6% |
| තායිලන්තය | 0.6% |
| ශ්‍රී ලංකාව | 0.1% |

මූලාශ්‍රය : ලෝක සංවර්ධන දර්ශක, ලෝක බැංකුව
(World Development Indicators, The World Bank)

නූතන අර්ථ ශාස්ත්‍රීය දැක්මෙහි ලා අවධාරණය කෙරෙන්නා වූ නවෝත්පාදන ආර්ථික නැඹුරුවක ඇති වැදගත්කම අවබෝධ කර ගැනීමට අප රට අසමත් වීමෙන් ගම්‍ය වන්නේ අපේ සාහිත්‍යමය උරුමයට රටේ ආර්ථික පිළිවෙත් සම්පාදකයන් විසින් පිටුපානු ලැබ ඇති බවකි.

***ස්වදේශිකවාදී වෛකල්පික ආර්ථික දැක්ම***

ඉහතින් දැක්වුණු පරිදි ප්‍රධාන අර්ථ ශාස්ත්‍රීය රාමුවලට යම් සමපාත වීම් තිබුණ ද, කුමරතුඟු අරුත් සතර වෙසෙසින් ස්වදේශිකවාදී වෙයි. එම දැක්ම හුදු වෙළෙඳ පොළකින් ඔබ්බට ගිය ජාතික රාජ්‍යයක් අරමුණු කර ගෙන තිබූ බව එතුමා ගේ ආර්ථික ප්‍රතිපත්ති නිර්දේශ මඟින් පිළිබිඹු වෙයි. ඒ සේම, එය දේශපාලන-ආර්ථිකමය වශයෙන් අධිරාජ්‍ය විරෝධී වූ බව ද පැහැදිලි වෙයි.

(i) දේශීය නිෂ්පාදන ආර්ථිකයේ හා ආහාර ස්වයංපෝෂිතත්වයේ වැදගත්කම

නිෂ්පාදන ආර්ථිකයක්, විශේෂ වශයෙන් කෘෂිකාර්මික හා කර්මාන්ත ආර්ථිකයක්, කරා උපායමාර්ගික ව සහ උත්සාහවත් ව යොමු වීමේ වැදගත්කම ද කුමාරතුංගයන් විසින් නොයෙක් වර තම සාහිත්‍ය නිර්මාණ තුළින් ගම්‍යමාන කරනු ලැබ ඇත.

"*පිළියමෙක් නැත් ද? නැති නම් අමුතුයෙන් නිපදවාගත යුතු යි. මේ නිෂ්පාදන යුගය යි.*"
[ලක් මිණි පහන - 2478 බක් අව 13 (1935/04/30),
ලක් මිණි පහන් කතු වැකි, 130 පිටුව]

*මෙහි වියූ පිළිය - ඇඟ නො ලා මැළිය*
*පිට රටින් විළිය - වැසුම නෑ එළිය*

*නිවන කුසෙහි ගිනි, සඟවන විළි ගත*
*පමණට වත් හෙළයිනි මොළවවූ නැත*
*ඉහළ මිලට පිටතිනෝ'වන බත වත*
*සියලු දවසැ එක පමණට එනු නැත !*

*(හෙළ මීයැසිය)*

බත (කෘෂි නිෂ්පාදන) හා වත (පේෂකර්ම නිෂ්පාදන) සම්බන්ධයෙන් තම රට තුළ ස්වයංපෝෂිත වීමේ වැදගත්කම යථෝක්ත කාව්‍යයන් මඟින් ප්‍රකාශ වේ.

රටක ආහාර-පාන අවශ්‍ය පමණ රට තුළ ම නිෂ්පාදනය වීම යනු ඒ රටෙහි දියුණුව - සමෘද්ධිමත් බව - ස්ථාවරත්වය පෙන්වන ලක්ෂණයක් ලෙස කුමාරතුංගයෝ දුටහ. අවශ්‍ය පමණ ආහාර ආර්ථිකය සතු ව නොමැති කම රටේ යහපතට හේතු නො වේ; ඉන් සමාජ තන්ත්‍රය පවා බිඳ වැටීමට ඉඩ ඇත.

*කුඹුරේ කම පමණ*
*රකිනා ලො දන පණ*
*කවරේ වෙන කරුණ*
*මෙහෙයා බල නුවණ*

*ඔබ ගේ බත - නො වවා කත*
*එ නො වේ හිත - රට යා පත*

(හෙළ මීයැසිය)

නො වවා කන බත රටක් අස්ථාවර කරයි; එහි ආර්ථිකය විදේශ විනිමය අර්බුදයකට තල්ලු කරයි; විදේශ බලපෑම් ඉදිරියේ අසරණ කරයි. දෙ වන ලෝක යුද්ධයෙන් පසු ජපානය සහල් නිපැයුමට ප්‍රමුඛතාවක් ලබා දුන්නේ ජාතික හා සමාජ ස්ථාවරත්වය අපේක්ෂාවෙනි [(Godo,2013), (OECD, 2009)].[10]

[10] ජපාන කෘෂිකාර්මික පිළිවෙතෙහි මූලික අවධානය යොමු වූයේ කෘෂි හා කෘෂි නොවන අංශ අතර ආදායම් විෂමතාව අවම කිරීමට ය. ඒ උදෙසා නිෂ්පාදන පිරිවැය වන්දි වැඩ සටහන යටතේ කෘෂි නිෂ්පාදන සඳහා ඉහළ දේශීය මිලක් රඳවා ගත් අතර ඉන් ගොවීන්ගේ ආදායම ඉහළ යාම සුරක්ෂිත විය. තව ද, මෙම ප්‍රතිපත්තිය යටතේ ජපානය සහල් ආනයනය මුළුමනින් ම තහනම් කළ අතර එය ජපානයට ස්වයංපෝෂිත භාවය කරා ළඟා වීමට ඉවහල් විය (OECD, 2009).

ආහාර සුරක්ෂිතතාව නොමැති රටක ජාතික ආරක්ෂාව පැවැත්විය නොහැකි ය. අභ්‍යන්තර මෙන් ම බාහිර තර්ජනයන්ට මුහුණ දෙන ජාතීන් පළමු කොට අවි-ආයුධ නොව තම ජනසමාජය හා හමුදාව අවශ්‍ය තරම් කාලයක් පෝෂණය කළ හැකි පමණට ප්‍රධාන ආහාර භෝගයන් සම්පාදනය කරනුයේ ඒ නිසා ය. එළාර රජු සමඟ සටනට අවතීර්ණ වීමට පෙර දුටුගැමුණු කුමරුන් විසින් සද්ධාතිස්ස කුමරුන් ලවා රට සහලින් ස්වයංපෝෂිත කරනු ලැබුවේ මේ උපායමාර්ගික ප්‍රවේශය අනුව ය (මහාවංශය, 24 වන පරිච්ඡෙදය, 57-58 ගාථා).[11] අප රට යටත් කර ගැනීම උදෙසා ප්‍රතිකාල් හමුදා විසින් යුද වැදීමට පෙර කුඹුරු යාය ගිනිබත් කෙළේ ද මේ න්‍යායයේ ම විලෝමය අනුගමනය කරමිනි (අබයසිංහ, 1966).

මෙවන් සාහිත්‍යමය පෝෂණයක් හා ඓතිහාසික අත්දැකීම් සහිත වූ හා ඈත අතීතයේ දී *පෙරදිග ධාන්‍යාගාරය* ලෙස ලෝ පතළ වූ සිංහලද්වීපය (ප්‍රනාන්දු, 2003) අද වන විට සහල් පමණක් නොව බොහෝ එළවුළු - පලතුරු -පොල් හා පොල් තෙල් මෙන් ම මත්ස්‍ය නිෂ්පාදන ද ආනයන කරන තත්ත්වයට පත් ව තිබීමෙන් පෙනී යන්නේ අප රටෙහි මෑත ඉතිහාසයේ දේශපාලන-ආර්ථික දේහය ඒ උරුමයෙන් හා අත්දැකීම්වලින් පැවැසෙන ප්‍රතිපත්ති හා උපාය මාර්ගික දැක්ම අනුගමනය කිරීමට අසමත් වී ඇති බව යි (2 වැනි වගුව).

වගුව - 2 : ශ්‍රී ලංකාවේ ආනයන සංයුතිය[12] - 2018

| | වටිනාකම (ඇමරිකානු ඩොලර් කෝටි) |
|---|---|
| සහල් | 10.7 |
| සීනි සහ රසකැවිලි | 25.0 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදන | 33.2 |
| පරිප්පු | 7.9 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව -2018

මේ කරුණ පිළිබඳ ව කුමාරතුංගයන් දක්වන අවධාරණය පහත උපුටනයෙන් ද මනා වැ පැහැදිලි වෙයි.

11 බටුවන්තුඩාව සංස්කරණය, මහාවංශය, 1967, 113 පිටුව.

12 2018 දී බඩ ඉරිඟු, මෑ, කුරක්කන්, කඟ, සියඹලා, කොමඩු, පොල් සහ පොල් තෙල් පිළිවෙළින් මෙට්‍රික් ටොන් 120.7 ක්, 47.8 ක්, 3.1 ක්, 5.4 ක්, 0.5 ක්, 0.3 ක්, 84 ක් හා 9.9 ක් ආනයනය කෙරී ඇති අතර, ඒ උදෙසා අමෙරිකානු ඩොලර් කෝටි 23.5 ක (ආසන්න ව රුපියල් කෝටි 4200 ක) විදේශ විනිමයක් වැය වී ඇත (ලංකාදීප , 2019, දෙසැම්බර් 06).

"*ලක්දිවට ඉතා බිහිසුණු කාලයෙකි. පිට රටින් සාල නැවැතිණි නම් අපට කෑම නැත. පිට රටින් එන රෙදි නැවතිණි නම් අපට විළි වැස්ම නැත. පිට රටින් එන යාන නැත් නම් අපට ගමන නැත. කොටින් මැ පිට රට පිහිට නැත් නම් අපට කළ හැකි කිසිවෙක් නැත. මෙ බඳු අසරණ තත්ත්වයකට පෙර කිසි කලෙකැ මේ රට වැටුණේ ද යනු විමැසියැ යුත්තේ යැ*"

[ලක් මිණි පහන -2478 පොසොන් අව 8 (1934/07/03),
ලක් මිණි පහන් කතු වැකි, 2/3 පිටු]

මහා පරාක්‍රමබාහු රජතුමා සිංහලද්වීපය පෙරදිග ධාන්‍යාගාරය බවට පත් කළේ රට තුළ සහල් නිපැයීමෙනි. ඒ ජාතික ආර්ථික දැක්මක් සහිත ව ය. කුමරතුඟුන් ගේ ජාතිකවාදී හා ස්වයංපෝෂණවාදී ආර්ථික දැක්ම ඊට අනුකූල වෙයි. අප රට පෙරදිග ධාන්‍යාගාරය වශයෙන් විරුදාවලී ලද්දේ දේශීය සහල් නිපැයුම් අතිරික්තයෙන් නොව ආනයනිත සහල් ප්‍රති-අපනයනය කිරීමේ හුවමාරු වෙළෙඳ පොළක් ඇති කිරීම ඔස්සේ බව විශ්වාස කරන වර්තමාන වාණිජවාදී ලිබරල් මත දරන්නන්ට කුමරතුඟු අරුත් සතරෙහි පදනම නොවැටහෙන සෙයකි. රජතුමා පරාක්‍රම සමුද්‍රය වැනි යෝධ වාරි කර්මාන්ත ඉදි කළේ දේශීය වී ගොවිතැන ප්‍රසාරණය කිරීමට නො වේ නම් වෙන කුමකට දැයි ඒ මතවාදය දරන නව සම්භාව්‍යවාදීන් පැහැදිලි කළ යුතු ය.

(ii) අධිරාජ්‍ය විරෝධී මුහුණුවර

ශ්‍රී ලංකාවේ නිදහස් අරගලයට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. බ්‍රිතානීන් විසින් උඩරට ගිවිසුම හරහා තමන් බරපතළ ලෙස රවටන ලද බව වටහා ගත් දේශීය බලවේග 1818 දී යටත් විජිත පාලකයන්ට එරෙහි ව ආයුධ සන්නද්ධ අරගලයකට එළැඹෙන්නේ ගිවිසුමින් තෙවසරක් ගත වීමටත් පෙර ය. එම අරගලය නිර්දය ලෙස මර්දනය කිරීමෙන් වසර 30 ක් තුළ 1848 දී තවත් ආයුධ සන්නද්ධ නිදහස් අරගලයක් දියත් විය. විවිධ පාවා දීම් හමුවේ ඒ ආයුධ සන්නද්ධ නිදහස් අරගල ජය ගත නොහැකි වුව ද, 1873 දී පාණදුරා වාදය මඟින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට එරෙහි ව පළමු තීරණාත්මක ජයග්‍රහණය අත්පත් කර ගැනීමට එම ස්වදේශිකවාදී බලවේග සමත් වී ඇත. අනගාරික ධර්මපාලයන් ගේ ජාතික චින්තන යළි පිබිදවීමේ ප්‍රයත්නයට පාදම වූයේත්, 1948 දී ලද සීමිත නිදහසත් 1972 දී පූර්ණ ජනරජයක් බවට පත් වීමත් දක්වා විකසනය වූයේත්, ඒ පාණදුරා වාදය ඔස්සේ ලද මතවාදී ජයග්‍රහණයයි. පියදාස සිරිසේන - කුමාරතුංග මුනිදාස - එස් මහින්ද හිමියන් වැනි කිවියන් හා සාහිත්‍යධරයන් විසින් ඒ ජාතික මතවාදී පදනම ජනවිඥ්ඥාණයෙහි පැළපදියම් කිරීමට ගත් ප්‍රයත්න නිදහස් අරගලය පෝෂණය කිරීමට උපස්තම්භක වී තිබේ.

කෙ සේ වුව ද, එම ජාතික නිදහස් චින්තනය දේශපාලනික ව ලද නිදහසේ මතවාදී අරටුව කර ගැනීමට ජාතිය අසමත් වී ඇත. අනගාරික ධර්මපාලයන් පුරෝකථනය කර තිබූ පරිදි ම අධිරාජ්‍යවාදීන් අප රට හැර ගියේ ඔවුන් ගේ සංස්කෘතියට අනුගත වූ කළු සුද්දන් පිරිසක් අතට බලය ලැබෙන පරිද්දෙනි. සියවස් එකහමාරක ජාතික නිදහස් අරගලයේ මතවාදී හා චින්තනමය වටිනාකම් අලුත ලද දේශපාලන රාමුව තුළ ගැබ් වීම අපගේ පාලකයන් මඟින් ම වළක්වාලීමට ඔවුන් සමත් වී ඇත. ජාතිකත්වය පිළිබඳ ව ඉන්දියාවේ

හා ශ්‍රී ලංකාවේ වර්තමාන ජන සමාජයන් විසින් දෙනු ලබන බව පෙනෙන වටිනාකම් අතර ඇති කැපී පෙනෙන වෙනසට හේතුව මෙය විය හැකි බව නිරීක්ෂණය කළ හැකි ය.

මේ තත්වය ආර්ථික ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ වඩාත් ඉස්මතු ව කැපී පෙනෙයි. බටහිර නිෂ්පාදනවලට ඒවායේ ඇති ආභ්‍යන්තරික වටිනාකම්වලට අමතර ව ආකල්පමය වටිනාකමක් ද අප සමාජයෙන් ලැබෙන බවක් පෙනෙයි. කුමාරතුංගයන් ඒ බව හා එහි බැරෑරුම් කම පාඨකයාට වටහා දීමට උත්සාහ කර ඇත්තේ පහත දැක්වෙන අයුරිනි:

"*මෙ රට හොඳ පාන වර්ග කො පමණ වත් ඇති වේ වා, එ සේ වුව ද යුරෝපා රටවලින් ගෙනෙනු ලබන පාන වර්ගවලට මැ අපේ මුදල් ඇදී යා යුතු යැ. ඉතා අඩු මිලට වෙන රටවලින් ගෙන්වා ගත හැකි රෙදි පිළී ආදිය කො තෙකුත් තිබියේ වා. එ සේ වුව ද ඒ සියල්ල නවත්වා යුරෝපා රටවලින් මැ අපට වුව මනා දෑ ඉතා වැඩි මුදල් ගණන් ගෙවා ගෙන්වාගත යුතු යැ.* "

[ලක් මිණි පහන -2478 ඇසළ පුර 14 (1934/07/24),
ලක් මිණි පහන් කතු වැකි, 10 පිටුව]

අඩු මිලට වෙන රටවලින් ආනයනය කළ හැකි රෙදි-පිළිවලට ඉවැසියැ නො හැකි තරම් මහත් කරයක් (තීරු බද්දක්) නියම කිරීම මඟින් යුරෝපීය රෙදි-පිළි සමඟ ශ්‍රී ලංකා වෙළෙඳ පොළේ නිදහසේ තරග කිරීමට ජපන් නිෂ්පාදනයන්ට ඇති ඉඩකඩ අහිමි කිරීම නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තියට පටහැණි වෙයි. ඒ අනුව, භාණ්ඩ ආනයනය නිදහසේ හා තරගකාරී ව කළ යුතු බවක් ඉඟි කරන මෙම ප්‍රකාශය නව ලිබරල්වාදී නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තියට අනුකූල වන්නක් බව බැලූ බැල්මට පෙනී යා හැකි ය. එහෙත්, කුමාරතුංගයන් විදේශීය නිෂ්පාදන අතර එ වන් නිර්බාධී තරගයකට ඉඩ තැබීමකට එකඟ වුව ද, දේශීය නිෂ්පාදන සමඟ එ සේ නිදහසේ තරග කිරීමට විදේශීය නිෂ්පාදනවලට ඉඩ තැබිය යුතු බවක් පැවැසෙන කිසිදු සාධකයක් එ තුමා ගේ ලේඛන අතර සොයාගත නොහැකි ය. ඒ අනුව පෙනී යන්නේ, දේශීය වැ සපයා ගත හැකි භාණ්ඩ සඳහා වෙළෙඳ පොළෙහි ප්‍රමුඛතාවක් ලබා දෙන්නා වූ සහ රට තුළ නිපැයිය නොහැකි භාණ්ඩ ආනයනයේ දී ඒ ඒ විදේශීය භාණ්ඩ නිදහසේ පූර්ණ තරගයකට මුහුණ දීමට ඉඩ හැර එහි වාසිය අප රටට හා අපේ පාරිභෝගිකයාට ලැබෙන්නා වූ වෙළෙඳ පිළිවෙතක් කුමරතුඟුන් විසින් නිර්දේශිත බවයි. ඒ අනුව එහි ඇත්තේ ලිබරල්වාදී දිශානතියකට වඩා ස්වදේශිකවාදී-ආරක්ෂණවාදී ප්‍රවේශයකි.

පර දේශීය දෑ අගය කරනුයේ මුග්ධයන් බවත් එ සේ කිරීම හෙළා දැකිය යුතු බවත් කුමරතුඟුවෝ පැවැසූහ. විරිත් වැකියේ එන පහත සඳහන් කව් දෙ පද ඊට නිදසුනි:

*ගැමි වහරින් හද පොපියන*
*අරුත් රසය නොහැඟී*
*මහ දද දන ගණ උපදින*
*කලැ පර දෑ අනැඟී*

(විරිත් වැකිය)

පිට රටවලින් ඉතා අධික පිරිවැයකට ආනයනය කෙරෙන භාණ්ඩවලට අප ජනසමාජය විසින් ලබාදෙන බව පෙනෙන උත්කර්ෂණ පරිභෝජනමය (conspicuous consumption) වටිනාකම නිසා ජාතියට දැරීමට සිදු වී ඇති ආර්ථික බර කුමරතුඟුන් ගේ විමර්ශනාත්මක විශ්ලේෂණයට ලක් වී ඇත්තේ ඒ පරිද්දෙනි.

මේ තත්වයෙන් ජාතික ආර්ථිකය මුදා ගැනීමට නිවහල් හා විදේශ ගැති නොවන ආර්ථික චින්තනමය විප්ලවයක අවශ්‍යතාව ඒ අනුව පැහැදිලි වෙයි. කුඩා දරුවන් සිටින සෑම සිංහල නිවසක ම සුදු පඹයකු ස්ථාපනය කර ඒ දරුවන් ලවා සුදු පඹයාට දෛනික ව උදේ හවා පහර දීමට සලස්වන මෙන් අනගාරික ධර්මපාල තුමන් විසින් උපදෙස් දෙන ලද්දේ (ගණේගම සරණංකර හිමි, 2017, 45 වැනි පිටුව) මේ පර ගැති මානසිකත්වය අපගේ අනාගත පරපුරේ සන්තානයෙන් තුරන් කිරීම උදෙසා විය යුතු ය. අනගාරික ධර්මපාලතුමා ආදීන් විසින් එතුණු ජාතික ප්‍රබෝධය නමැති රණ ගිනි පන්දමට තෙල් ගසා අවුළන ලද්දේ කුමාරතුංග මුනිදාස මහතා විසිනැ යි හරිශ්චන්ද්‍ර විජයතුංගයන් විසින් කරන ලද සටහනේ (විජයතුංග, 2001, 46 වැනි පිටුව) යුක්ති යුක්ත භාවය මේ අනුව සනාථ වෙයි.

(iii) ණය බරෙන් නිදහස් වීමේ වැදගත්කම


ණය බරෙන් රට නිදහස් කර ගැනීම කුමරතුඟු දැක්මේ එක් මූලස්තම්භයක් බවත් එය ඔහු ගේ ස්වදේශිකවාදී චින්තනයට අනුව න්‍යාය පත්‍රයෙහි ප්‍රමුඛත්වයට පත් විය යුතු අවශ්‍යතාවක් බවත් පෙනී යයි.

"*රජයේ මහා ණය මුදල සම්බන්ධයෙන් කියැවුණු කරුණු එහි ලා ප්‍රධාන සේ සැලැකියැ හැක්කේ යැ. දැනට කරුණු පවත්නා තත්ත්වය දෙස බලන විට අලුත් ණය මුදලකට රට යට කිරීම අනවශ්‍ය බවත් දැනට ණය වැ සිටින මුදල් ගණනින් පවා මඳ මඳ වශයෙන් නිදහස් වන්නට ඉඩ ඇති බවත් පෙනේ.*"

[ලක් මිණි පහන - 2479 නිකිණි පුර 7 (1935/08/06),
ලක් මිණි පහන් කතු වැකි, 180 පිටුව]

කුමරතුඟුන් ගේ වකවානුවේ පවා ශ්‍රී ලංකා රාජ්‍යයේ සැලකිය යුතු ණය බරක් තිබූ බවත් ඒ අතර රට නිදහස් කර ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කිරීමෙන් පෙනී යන්නේ විදෙස් ණය පිළිබඳව ද එතුමා තුළ වූ කණස්සල්ල බවත් වටහා ගැනීම අපහසු නැත. පුද්ගලයකු ගේ - කුටුම්බයක - ආයතනයක මෙන් ම රටක ද ස්වෛරී තීරණ ගැනීමට අවකාශ විවර වන්නේ ඒ ඒ ඒකකය කෙතරම් ආර්ථික වශයෙන් ස්වාධීන ද යන්න අනුව යි. ණය ගැති භාවය යනු ස්වයංතීරණ ගැනීම අවහිර කරන්නකි. නිදහස අහිමි කරන්නකි. ණය නැති බව සැපයක් ලෙස බෞද්ධ ආර්ථික දර්ශනයේ හඳුනා ගැනෙන්නේ එ බැවිනි. අණන සුඛය අගය කරන සංස්කෘතියකට උරුම කම් කියන ශ්‍රී ලාංකික ආර්ථික දේහයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන දෙ අංශයේ ම එකතුව මේ වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 60% කට ආසන්න විදේශ ණය බරකට යටත් වීම (රූප සටහන -1) සහ රාජ්‍ය අංශයේ පමණක් සමස්ත (දේශීය හා විදේශීය) ණය ප්‍රතිශතය 80% ඉක්වා තිබීම යනු කුමාරතුංග ආර්ථික දැක්මට කෙරෙන අවමානයකි.

රූප සටහන - 1 : ශ්‍රී ලංකාවේ දළ විදේශ ණය (දදේනි හි ප්‍රතිශතයක් ලෙස)




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

(iv) ස්වෛරීත්වයේ අගය හා දේශවාත්සල්‍යයේ ආර්ථිකය

රටක් - ජාතියක් හුදු වෙළෙඳ පොළකට ලඝු කළ හැකි නො වේ. නව ලිබරල් දේශපාලන-ආර්ථික දැක්ම ජාතික රාජ්‍ය සංකල්පයට පටහැණි වන්නේ ඒ දැක්ම තුළ ඇත්තේ නිෂ්පාදකයන් - පාරිභෝගිකයන් හා වෙළෙන්දන් පමණක් වන බැවිනි. ජාතිකත්වයකට අගයක් ලැබෙන විට එය හුදු භූමි - ශ්‍රම - ප්‍රාග්ධන - ව්‍යවසායකත්ව චතුස්සාධකයන්ගෙන් පමණක් පැහැදිලි කළ නොහැකි හැසිරීමකට පුරවැසියා පොලඹවයි. නව ලිබරල්වාදයට එම ප්‍රවණතාව රුස්සන්නේ නැත. රටක අනාගත සෞභාග්‍යය අරමුණු කෙරෙන ස්වදේශිකවාදී දේශපාලන- ආර්ථික දැක්මක් සමඟ අක් මුල් නොමැති පාරිභෝජනවාදී සත්ව කොට්ඨාසයක උපයෝජනය උපරිම කෙරෙන්නා වූ හා ඒ වෙනුවෙන් ජාතියක ස්වෛරීත්වය මෙන් ම අනාගත පරපුරක අයිතීන් පවා උකස් කෙරෙන්නා වූ නව ලිබරල්වාදී දේශපාලන ආර්ථික දැක්මක් එකිනෙක හා නොගැළපෙන්නේ ඒ නිසා ය.

කුමරතුඟුන් තම ගැදි-පැදි නිමැවුම් ඔස්සේ හෙළ පුරවැසියා තුළ, වෙසෙසින් අනාගත හෙළ පරපුර තුළ, දේශවාත්සල්‍ය ගුණය ජනනය කිරීමට හා ඔප මට්ටම් කිරීමට ප්‍රබල උත්සාහයක් දරා ඇත. ඉන් තෝරා ගත් පැදි කිහිපයක් පහතින් දැක්වේ.

*ඉදිරියට මැ යවු, හෙළයෙනි,*
*ඉදිරියට මැ යවු...*

*මරුට සිනා සෙවු, හෙළයෙනි,*
*මරුට සිනා සෙවු ...*

*අප ගේ රටෙහි මැ යැදැ යැදැ*
*ගැති වී තව තව හිඳිමු ද?*
*නිදහස නැති දිවි කුමට ද?*
*ඉදිරියට මැ යවු.....*

*දෑ ගති සලකවු, හෙළයෙනි,*
*දෑ ගති සලකවු...*

*පෙර කලැ අප ගේ මුත්තෝ*
*දිවි දී දැය රැක ගත්තෝ*
*වෙමු ද ඉතින් අපි ගැත්තෝ?*
*ඉදිරියට මැ යවු.....*

*හෙළයට දිවි දෙවු, හෙළයෙනි,*
*හෙළයට දිවි දෙවු ...*

*අප රට හෙළ, අප දෑ හෙළ*
*අප බස හෙළ, හෙළ, හෙළ, හෙළ*
*නුවණත් හෙළ, නිවනත් හෙළ,*
*ඉදිරියටම මැ යවු.....*

*ඉදිරියට මැ යවු, හෙළයෙනි,*
*ඉදිරියට මැ යවු.*

(පුබුදුව, කුමර පැදි සගනුව, 3 වැනි පිටුව)

*මගෙ රට මගෙ දැය නිසා*
*යුද වැද සතුරන් නසා*
*ම දිවි ගියත් මට එ සා*
*යස වෙ ද සිය වස් වසා*

*සිටිය ද ගල් ගෙහි වැදී*
*පණත් නමත් යෙයි සිඳී*
*එ පණ රටට දැයට දී*
*නම රැකැ ලවු නො පැරැදී*

*රටට දැයට හිත දපා*
*මඳකට දිවි ලොබ ලොපා*
*කළ මෙහෙයක් නැති දෙපා*
*හෙළයකු දැකුමත් එපා*

(හෙළ මීයැසිය)

ආර්ථික නිෂ්පාදන සාධක සම මට්ටමක ඇති සමාජ දෙකක් අතර දේශමාමකත්වයට අගයක් ලැබෙන සමාජයක් එ සේ නොලැබෙන සමාජයකට වඩා නිස්සරණාධ්‍යාශයෙන්

ජාතික අරමුණු කෙරෙහි දායක වෙනු ඇති බව මේ කවිවලින් දේශවාත්සල්‍යය ඔප් නැංවීමට කුමරතුඟුන් විසින් දරනු ලැබ ඇති ප්‍රයත්නයේ පදනම් තර්කණය විය යුතු ය.

කුමාරතුංග දැක්මට අනුව පාරිභෝගිකයා දේශවාත්සල්‍යයෙන් යුතු නම්, ආයාත භාණ්ඩවලට වඩා දේශීය නිපැයුම් ඉල්ලීමට වැඩි නැඹුරුවක් දක්වනු ඇත. ඒ මඟින් කේන්සියානු ආවරණය ක්‍රියාත්මක වී දේශීය නිෂ්පාදකයා දිරි ගැන්වෙනු ඇති අතර දේශීය ප්‍රාග්ධන සම්පාදනය ඉහළ නැංවී ඒ මත ඉදිරි නිෂ්පාදන ශක්‍යතාව පුළුල් වෙනු ඇත. තව ද, ඒ නිසා ජනනය වෙන ගෙවුම් ශේෂ වාසිය ඔස්සේ විදේශ ණය බර අඩු වීම හා පරිභෝජනයට අවශ්‍ය දෑ වෙනුවට ආයෝජනයට අවශ්‍ය තාක්ෂණය හා යන්ත්‍රෝපකරණ ගෙන්වීමට අවශ්‍ය විදේශ සම්පත් සම්පාදනය ද ඉටු කෙරෙනු ඇත. ඉන් ගම්‍ය වන්නේ ඒ මඟින් දේශීය නිෂ්පාදනයට අමතර ජවයක් ලැබෙනු ඇති බව යි. එ සේ නම්, දේශවාත්සල්‍ය ගුණය ආර්ථික වෘද්ධි ශ්‍රිතයේ නවමු නිර්ණායක සාධකයක් විලසින් සැලැකිය හැකි විය යුතු ය. තාක්ෂණය නමැති පරාමිතිය බහිර්කෘත (disembodied) ආර්ථික සාධකයක් ලෙස යෙදිය හැකි නම් දේශවාත්සල්‍යය එ සේ නො යෙදීමට ඉඩක් නැත. ඒ අනුව, දේශවාත්සල්‍යය (P) පස් වැනි නිෂ්පාදන සාධකයක් ලෙස බහිර්කෘත ව නිෂ්පාදන සමීකරණය තුළට පහත දැක්වෙන පරිදි හඳුන්වා දෙනු ලැබිය හැකි ය:[13]

$$Y = f(R, L, K, E, P)$$

$$Y = A.\ R^{\alpha}.\ L^{\beta}.\ K^{\delta}.\ E^{\theta}.\ P^{\lambda}$$

මින් ගම්‍ය වන්නේ සංවර්ධනය උදෙසා වැදගත් නමුදු මෙතෙක් එ සේ නොසැලැකුණු, සැඟවුණු ආර්ථික සාධකයක් කුමරතුඟුන් සිය සාහිත්‍ය නිර්මාණ තුළින් පිළිබිඹු කර ඇති බව යි.

අසල්වැසි භාරතය මේ නව ආර්ථික නිෂ්පාදන සාධකය හා එහි වැදගත්කම මැනැවින් අවබෝධ කරගෙන ඇති බව පෙනේ. ඒ රටේ කවර ක්ෂේත්‍රයක වුව ද දේශවාත්සල්‍යය ඉස්මතු කරවීමට දැරෙන ප්‍රයත්නය ඉතා තීව්‍ර බව නොරහසෙකි. සිනමාවේ පටන් විද්‍යාත්මක නිර්මාණ තෙක් සමස්ත ක්‍රියාවලීන්හි යම් පොදු ගුණාකාරයක් හඳුනා ගනු ලැබිය හැක්කේ නම් ඒ ඉන්දියානු දේශප්‍රේමීත්වය යි. තමන් ඉන්දියානුවකු වීම පිළිබඳ අභිමානයක් සැම භාරත පුරවැසියකුට ම ඉතා කුඩා කල පටන් මැ ලැබෙයි. ‘තම රට දේ සිරි සැප දේ’ යන සංකල්පය හුදු නාම මාත්‍රික තේමාවක් ලෙස අප රට තුළ සැලකුණ ද, භාරතයේ එය ප්‍රබල වෙළඳ උපක්‍රමයකි, අනායාසයෙන් කෙරෙන ආනයන ආදේශන උපායකි. විදෙස් දෑ අගය කිරීම භාරත ජන සමාජය තුළ හෙළා දැකෙයි. ඇම්බැසඩර් හෝ මරුති හෝ මෝටර් රථයක් භාවිතය ඉන්දියානුවාට ආඩම්බරයකි. එ සේ වන්නේ ආනයනිත මෝටර් රථවල ක්‍රියාකාරී ගුණාංග සමඟ සැසැඳුමෙන් නො වේ. හුදු ඉන්දියානු නිෂ්පාදනයක් වීම නිසා ම ය. අන් සියලු භාණ්ඩ හා සේවා පිළිබඳ තත්වය ද එය ම ය. ඒ

---

[13] මෙහි R, L, K, E සහ P තුළින් පිළිවෙළින් භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය හා දේශවාත්සල්‍යය නිරූපණය වේ. මෙය, නිෂ්පාදන සමීකරණය තුළ අනෙකුත් සාධකයන්හි නිෂ්පාදන ජවය ඉහළ දමන අන්තර්කෘත සාධකයක් ලෙස $Y = A.R^{(\alpha+p)}.L^{(\beta+p)}.K^{((\delta+p)}.\ E^{(\theta+p)}$ අයුරු ද අරුත් ගැන්විය හැකි ය.

අනුව ආනයන ආදේශනයට ඉන්දියාවේ දී යෙදිය යුතු ආයාසය ශ්‍රී ලංකාවේ හෝ දේශවාත්සල්‍යයට ඉහළ අගයක් ලබා දී නොමැති වෙනත් රටක හෝ යෙදිය යුතු ආයාසයට බොහෝ අඩු වීම ස්වාභාවික ය. එ වැනි තත්වයක දී දේශීය ආයෝජන හා පරිභෝජන වියදම් වැඩි වශයෙන් දේශීය නිෂ්පාදකයාට ආදායම් බවට පත් වන්නේ නිතැතිනි.

අප රට තුළ කවර පමණකට නො සලකා හරිනු ලැබුව ද කුමරතුඟු දැක්ම නිසැක වශයෙන් ස්වදේශිකවාදී - ජාතිකමය තිරසරවාදී වෙයි. ඒ බව පහත දැක්වෙන උද්ධෘතයන් ගෙන් පිළිබිඹු කෙරෙයි:

*"අපේ දේ අපට වුව මනා පරිදි විකුණාගන්නට නැත් නම්, පිට දේ අපට වුව මනා පරිදි ගෙන්වාගන්නට නැත් නම්, අප රටේ ඉඩම් මැ අප රටට වැඩ සැලැසෙන පරිදි වවාගන්නට නැත් නම්, අප රටේ මැ ජල බලයෙන් අපේ ප්‍රයෝජනය සඳහා විදුලිය උපදවාගන්නට අවසර නැත් නම්, අපට මෙ ලොවැ ජීවිතයෙන් ඇති ඵලය කිම ?"*

[ලක් මිණි පහන -2478 ඇසළ පුර 14 (1934/07/24), ලක් මිණි පහන් කතු වැකි, 10 පිටුව]

*"අපේ පොළෙහි රබරයෙහි මිල පහළ මැ පෙත්තට බැසැ, කවර කල්හිත් නැඟුමට වඩා හිඟුමට කැමැති අප රටේ දීනයනට අභිමත ලෙස හැසිරෙන්නට මඟ පාදයි. පියන් මුත්තන් සපයා තුබූ දැයින් කා, බී, සැරැසී, උඩඟු වී, වැනැහී ගිය අප ගේ ශ්‍රේෂ්ඨයන් උන් සිටි තැනුදු පිට රැටියන් අතට ගොස් තව මඳ කලෙකැ දී මෙ රට මිනිසුනට අයත් ඉඩමක් ගෙයක් නැතැයි කියැ යුතු වන තරමට කරුණු සැලැසෙයි."*

[ලක් මිණි පහන -2478 බක් අව 5 (1935/04/23), ලක් මිණි පහන් කතු වැකි, 126 පිටුව]

වත්ත බද්දට දී ඇස්සට දත නියවන වෙන්දේසිකාර ආර්ථික ව්‍යාධියකට ගොදුරු වී ඇති වත්මන් ශ්‍රී ලාංකිකයා වෙනුයෙන් දශක අටකට පෙර දුර දැක්මෙන් යුතු වැ මේ වැකි ලියැවුණු සෙයෙකි. ඔවුන් එම ව්‍යාධියෙන් නිරෝධනය කර නො ගැනුණොත් අනාගත පරපුරට තමන් ගේ යැයි කිව හැකි රටක් ඉතිරි නොවන බව කුමාරතුංගයෝ සිය ලේඛනයන් මඟින් අවධාරණය කරති.

*"දැන් අපි අප රටෙහි දී මැ දාසයෝ වම්හ. සෙස්සවුන් ගේ අණ අපි පිළිපදිමු. අපේ ගම් බිම් අනුන් අයත් යැ....කා ගේ වත් මේසයක් යට වැටෙන කටු රොඩු අවුළා කා තොල කට ලෙවැ කන්නවුන් හා අප හා අතරේ කවර වෙනසෙක් ද? අනේ තුබුණු උසස් කම ! අනේ තිබෙන පහත් කම ! මේ සිතිවිලිවලට ඉඩ දෙන කවර නම් ළයෙක් නො කකියා ද?"*

(කියවන නුවණ - ස වන පොත - 29 පිටුව)

රටේ භූගෝලීය හා ස්වාභාවික සම්පත් විදේශයන්ට උගස් කර ඒ උගස් මුදලින් එදිනෙදා පරිභෝජනයට ඇවැසි දෑ ආනයනය කරමින් තව තවත් ණය වන දේශයකට කවර නම් අනාගතයෙක් ද? හම්බන්තොට වරාය චීනයටත්, තිරිකුණාමලේ තෙල් ටැංකි ඉන්දියාවටත් දේශයේ උපාය මාර්ගික ව වැදගත් තවත් භූමි ප්‍රදේශයන් විවිධ ගිවිසුම්

ඔස්සේ වෙනත් රටවලටත් බදු දෙන හා එ සේ දීමට කැස කවන පාලකයන් මෙන් ම අපේ අනාගත පරම්පරාව නොරටුන් ගේ කුණු රොඩු අවුළා කන්නන් බවට පත් කරන ඒ පාලකයන් ගේ අනුශාසකයන් තම කුඩා කල දී හෝ කුමාරතුංගයන් ගේ කියවන නුවණ කියවා දේශීයත්වයේ නුවන පාදා ගත්තන් නම් විය නොහැකි ය.

කුමරතුඟුන් විසින් කුඩා දරුවන් වෙනුවෙන් රචනා කෙරුණු 'මඟුල් කෑම' (කුමාරතුංග, 1997) තවත් එ වැනි වැදගත් උපාය මාර්ගික ඇස් ඇරවීමක් ලෙස හඳුනා ගනු ලැබිය හැකි ය. එ සේ වන්නේ ස්වෛරීත්වය කැප කෙරෙමින් අත්සන් කෙරෙන අන්තර්ජාතික වෙළෙඳ ගිවිසුම්වලට තමන් කුඩා අවදියේ මඟුල් කෑම විමැසිලිමත් ව කියවා ඇති කිසිදු ශ්‍රී ලාංකික නිලධාරියකු හෝ ප්‍රතිපත්ති තීරකයකු හෝ නො පෙලැඹෙනු නියත බැවිනි. නො ගැළපෙන මඟුලකට යොමු කරවමින් කුකුළාගමුව කොල්ලා කෑමට හිවලාවල හිවලුන් යෙදූ උපාය පිළිබඳ ව කුමරතුඟුන් රචනා කළේ *එටිකා* වැනි "මඟුල් කෑම්" හරහා ආර්ථිකයේ ස්වාධීනත්වය මෙන් ම ජාතියේ ස්වෛරීත්වය ද විනාශයට ලක් වීමට ඇති අවදානම පුරෝකථනය කරමින් ඒවාට එරෙහි ව අනාගත ශ්‍රී ලාංකිකයා මතවාදී ව සන්නද්ධ කිරීමට විය හැකි ය. ඔවුන් ගේ ඒ ප්‍රයත්නය එල රහිත වී ඇත් දැ යි සැක සිතෙනුයේ මෑත කාලයේ රට තුළ ක්‍රියාත්මක වූ සංවර්ධන ආර්ථික ප්‍රතිපත්ති දෙස විමැසිල්ලෙන් බැලීමේ දී ය.

**සංස්ලේෂණය**


සමස්තයක් ලෙස ගත විට කුමාරතුංගයන්ගේ කෘති දේශීයත්වය - ස්වෛරීත්වය - ජාතික නිදහස හා එහි දිගු කාලීන තිරසර පැවැත්ම දිරිමත් කිරීම පොදු ගුණාකාරය කැරැගෙන නිමැවී ඇත. ඒවා කුමාරතුංගයන් ගේ සාහිත්‍ය නිර්මාණවල දක්නට ඇති අනුල්ලංඝනීය ලක්ෂණ වෙයි. කුමරතුඟු ආර්ථික දැක්මක් ඉස්මතු කර ගැනීමට දැරෙන වත්මන් ප්‍රයත්නයේ දී මේ බව තහවුරු වී පෙනෙයි.

තිරසර බව යනු හුදු පාරිසරික සංරක්ෂණය පමණක් නොවන බවත් එය සමාජ - ආර්ථික - පාරිසරික මූලයන් ත්‍රිත්වයක අන්තර්-සම්බන්ධතාවන් මත තහවුරු කෙරෙන්නක් බවත් වර්තමාන තිරසර සංවර්ධන ආර්ථික ඉගැන්වීම් තුළ ගැබ් වෙයි. කුමාරතුංග මුනිදාසයෝ සිය නිර්මාණ ඔස්සේ මේ ක්ෂේත්‍ර තුන ම ස්පර්ශ කරති. පාරිසරික සංරක්ෂණය හා නූතන ආර්ථික සංවර්ධනය එකිනෙක ගැටෙන අයුරු කුමාරතුංගයන් අනාගත පරපුරේ සන්තානය තුළ තැන්පත් කිරීමට සමත් වූ අපූරුව කියවන නුවණෙහි 'අලි උවදුර' කියවා ඇති පාඨකයාට රහසක් විය නොහැකි ය (කුමාරතුංග, 2015). වර්තමානය වන විට උග්‍ර වී ඇති අලි-මිනිස් ගැටුම කුඩා දරුවා ගේ මනස තුළ චිත්‍රණය කෙරුණේ දුම්රියක් දුටු අලියා තමන් මෙතෙක් ආධිපත්‍යය දැරූ වනාන්තරයෙන් පලා යාමට තීරණය කිරීම ඔස්සේ ය. සංවර්ධන මාවත තුළ පරිසර හා ස්වාභාවික සම්පත් විනාශ නො විය යුතු බවත්, වෙළෙඳ පොළ යාන්ත්‍රණය අසමත් වන්නා වූ මෙම ගැටලුව විසඳීමට සංවර්ධන උපාය මාර්ග පාරිසරික තිරසාරත්වය තහවුරු කළ යුතු බවත්, ඊට රාජ්‍ය මැදිහත් වීම මෙන් ම ජන සමාජය තුළ හරිත ආකල්ප ප්‍රවර්ධනය කළ යුතු බවත්, මින් ඉස්මතු කෙරෙන පාඩම යි.

කෙ සේ වුව ද, කුමාරතුංගයන් ගේ තිරසර සංවර්ධන සංකල්පය ඉහතින් සඳහන් වුණු පාරිසරික - සමාජීය - ආර්ථික මූලයන්ට සීමා නොවී ඉන් ඔබ්බට වූ ආර්ථික ස්වදේශිකත්වය හා බැඳුණු ජාතික නිදහස හා ස්වෛරීත්වය වැනි සාධක තෙක් පුළුල් වී ඇති බව නිරීක්ෂණය වෙයි. උපයෝගීත්වය, තෘප්තිය, ලාභය උපරිම කර ගැනීම ප්‍රමුඛතාව කොට ගත් නව සම්භාව්‍යවාදී ආර්ථික දැක්මට සපුරා ම වෙනස් වූ මෙම නව තිරසර සංවර්ධන සංකල්පය ජාතිකත්වය හා සම්පත් පිළිබඳ සර්ව කාලීන ස්වෛරීත්වය ද පාදක කර ගත්තකි. එ නම්, ජාතික ස්වෛරීත්ව තිරසර සංවර්ධන (National Sovereign Sustainable Development) දෘෂ්ටිවාදයකි. එ මෙන් ම, රාජ්‍යත්වයට ජාතික සම්පත්වල භාරකාරත්වය විනා අයිතිය හිමි නොවන බවට වන මිහිඳු ප්‍රඥප්තියට ද සමගාමී ව යන මේ ජාතික ස්වෛරී තිරසර සංවර්ධන දැක්ම ජාතික හා ඓතිහාසික උරුමයන්ට ගැළපෙන්නා වූ ආර්ථික දර්ශනයකි.

කුමාරතුංග ආර්ථික දැක්ම තුළ ඇති ඒ සුවිශේෂත්වය පහත පරිදි නිරූපණය කරනු ලැබිය හැකි ය:

රූප සටහන-2: කුමරතුඟ මුනිදසුන්ගේ ජාතික ස්වෛරී තිරසර ආර්ථික සංවර්ධන දැක්ම




## නිගමනය සහ සමාප්තිය

හෙළ බසට හා වියරණයට මහ මෙහෙයක් කළ වියතකු ලෙස කුමරතුඟු මුනිදසුන් ගේ ප්‍රතිරූපය ප්‍රකට යැ - අවිවාදිත යැ. එහෙත්, එතුමා ජාතියේ ඉදිරි ගමනට මඟ පෙන්වන අර්ථ ශාස්ත්‍රීය දැක්මක් ද ඉදිරිපත් කර ඇති බව දන්නෝ විරල වෙති. කෙතෙක් දුරට සමුච්චිත ද යන්න විවාදිත විය හැකි නමුදු කුමරතුඟු ලේඛන සැලැකිය යුතු ප්‍රමාණයක් පරිශීලනයෙන් එතුමා විසින් සමාජ ගත කිරීමට යත්න දරනු ලැබ ඇති ජාතික අර්ථ ශාස්ත්‍රීය දැක්ම ඉස්මතු කර දැක්වීම මේ විමසුමෙහි ලා දරන ලද ප්‍රයත්නය යි.

කුමාරතුංගයන් ගේ කෘතීන් තුළින් පිළිබිඹු වන ජාතික සංවර්ධන අර්ථ ශාස්ත්‍රීය දැක්ම 3 වැනි වගුවෙහි ඇති අයුරු විකල්ප ආර්ථික න්‍යායයන් හා සසඳමින් සම්පිණ්ඩනය කළ හැකි ය.

වගුව - 3 : කුමාරතුංග අර්ථ ශාස්ත්‍රීය දැක්මෙහි මූලිකාංග හා දිශානති

| **කුමාරතුංග දැක්මෙහි අංග** | **ප්‍රකාශිත හෝ ගම්‍ය හෝ ප්‍රතිපත්ති දිශානති** | **සැසැඳීම හෝ සුවිශේෂත්වය** |
|---|---|---|
| නිෂ්පාදන ජවය | ආනයන ආදේශනය<br>ආයෝජන නැමියාව හා පිරිමැසුම් ආර්ථිකය<br>උපරිව්‍යුහ සංවර්ධනයට රජය මැදිහත් වීමේ අවශ්‍යතාව<br>ආයෝජන මත පිරිවැයෙහි ජාතික ආර්ථිකමය ප්‍රතිලාභ උපරිම කිරීම | කේන්සියානු ආර්ථික න්‍යාය හා නව වෙළෙඳ වාදය |
| | කාර්යක්ෂමතාව<br>වගවීම හා යහපාලනය<br>ශ්‍රම සම්පත කුළු ගැන්වීම<br>අන්තර්ජාතික වෙළෙඳ තරගයෙන් වාසි ගැනීම<br>භාණ්ඩ නිෂ්පාදනය සේවාවන්ට ඉහළින් තැබීම<br>නවෝත්පාදන සහ පර්යේෂණ<br>උත්සාහවත් බව | නව සම්භාව්‍යවාදී ආර්ථික න්‍යාය |
| සමානාත්මතාව | සම්පත්වල පොදු අයිතිය හා පොදු භාවිතය<br>ආදායම් බෙදා හැරීම<br>ඉහළට ගලන ආර්ථික ආවරණයක් සහිත ජන සහභාගිත්ව ආර්ථික ක්‍රමයක්<br>පීඩිත පන්තියේ අවශ්‍යතා සැපිරීම හා දිළිඳු බව පිටුදැකීම | මාක්ස්වාදී - සමාජවාදී දේශපාලන ආර්ථික න්‍යාය හා බෞද්ධ සමාජ දර්ශනය |
| පාරිසරික සංවේදීත්වය | ජෛව පද්ධති සහජීවනය<br>ස්වාභාවික සම්පත්වල සමබර උපයෝජනය | තිරසර සංකල්පය හා බෞද්ධ සමාජ දර්ශනය |
| ජාතික ස්වෛරීත්වය හා දේශවාත්සල්‍යය | අධිරාජ්‍ය විරෝධය<br>දේශීය නිෂ්පාදන ප්‍රමුඛතාව<br>ස්වයංපෝෂිතත්වය<br>ජාතික සම්පත්වල ස්වදේශීය අයිතිය තහවුරු කිරීම<br>විදේශයන්ට ණය නොවීම | කුමාරතුංග ස්වදේශිකවාදය හා බෞද්ධ ආර්ථික දර්ශනය |

ජාතික සංවර්ධනමය උපාය මාර්ගික ප්‍රවේශයක් සකසා ගැනීමට ප්‍රතිපත්ති තීරකයන්ට උපයෝගී කර ගත හැකි අදහස් සමූහයක් විසි වැනි සියවස මුල භාගයේ තරම් ඈත දී කුමාරතුංග මුනිදාසයන් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති බව ඉහතින් සාරාංශගත කෙරුණු පරිදි එතුමා ගේ ලේඛනයන් පරිශීලනය කිරීමේ දී පෙනී යයි.

සාම්ප්‍රදායික න්‍යායයන් වූ සම්භාව්‍යවාදී, නව සම්භාව්‍යවාදී, කේන්සියානුවාදී හෝ සමාජවාදී හෝ රාමු තුළ පිහිටුවිය හැකි අදහස් හා නිර්දේශ ද විටෙක කුමරතුඟු ලේඛන තුළ නිරීක්ෂණය වුව ද, සමස්තයක් ලෙස, එතුමාගේ බොහෝ අර්ථ ශාස්ත්‍රීය අදහස් නව ලිබරල්වාදී දේශපාලන දැක්මට හෝ නව සම්භාව්‍යවාදී ආර්ථික න්‍යායයට හෝ අනුගත නො වේ. ඒවා තුළ සම්පත්වල පොදු අයිතිය අගය කෙරෙයි. රාජ්‍ය මැදිහත්කරණය ප්‍රතික්ෂේප නො වෙයි. වෙළෙඳ පොළ අසාර්ථකතා ඇති බවට හා ඒ නිසා රාජ්‍ය මැදිහත්කරණය සාධාරණීකරණය වන බවට නූතන ආර්ථික විද්‍යාවේ පවා සාකච්ඡාවට බඳුන් වන පර්යේෂණය, නවෝත්පාදනය, සමාජ සාධාරණත්වය හා පාරිසරික ස්වස්ථතාව වැනි සංවර්ධන අවශ්‍යතා හමුවේ රජයේ කාර්ය භාරය අවධාරණය වෙයි. එහෙත්, එ වැනි මැදිහත්වීම් ඵලදායී විය යුතු බව ද, නාස්තිකාර නො විය යුතු බව ද ඉස්මතු කර දැක්වෙයි.

කුමරතුඟු ආර්ථික දැක්ම අතිශයින් ම ස්වදේශිකවාදී වෙයි. එය ජාතියේ අනාගත අභිවෘද්ධිය, ස්වයංපෝෂිතත්වය හා ජාතික ස්වෛරීත්වය තහවුරු කෙරෙන ජාතික තිරසාර සංවර්ධන දිශානතියක් ඔස්සේ සකස් වූවකි. රජයේ කාර්ය භාරය හා වගකීම් එහි ලා අවධාරණය කරනු ලැබ ඇත. රාජ්‍ය යන්ත්‍රණය මහජන සුබසිද්ධිය වෙනුවෙන් හා ජාතියේ අනාගත අභිවෘද්ධිය තහවුරු කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක විය යුතු ය. රාජ්‍ය මුදල් නිසි පරිදි කළමනාකරණය කර ඒවා ආදායම් විෂමතාව දුරලීමට, නවෝත්පාදනයන් වැඩි කිරීමට, යටිතල පහසුකම් සංවර්ධනයට භාවිත කරනු විනා සංවර්ධනයේ මුවාවෙන් ජාතිය ණය නොකිරීමට වග බලා ගත යුතු බව ද ඒ ආර්ථික දැක්මෙහි නිරූපිත යි.

තව ද, කුමාරතුංග සංවර්ධන ආර්ථික දැක්ම බෞද්ධ ඉගැන්වීම්වලට අනුකූල වූ පිරිමැසුම් පාදක අල්පේච්ඡ හා අවශ්‍යතා තෘප්ත වීම මත ගොඩනැඟෙන තුටු-පහටු ආර්ථික සංවර්ධන මාවතකට (Happiness-oriented economic development path) නැකම් කියන බව ද නිගමනය කළ හැකි වෙයි. කෑදර හා උත්කර්ෂණ පරිභෝජනවාදී ආර්ථික රටාවෙන් මිදීමට හා ඒ තුළ ඉහළ නැංවිය හැකි වන දේශීය ආයෝජනයෙන් බල ගැන්වෙන නිෂ්පාදන ආර්ථිකයකට යොමු වීමට ද නිර්දේශ කෙරෙයි.

ඒ සියලු අදහස් අතර ඉදිරියෙන් ම කැපී පෙනෙන කුමාරතුංග අර්ථ ශාස්ත්‍රීය දායකත්වය වන්නේ ‘දේශප්‍රේමීත්වය’ ජාතික සංවර්ධන ඉදිරි දැක්මෙහි අවියෝජනීය සාධකයක් ලෙස අලුතින් හඳුනා ගැනීමට දොරටු විවර කර දීම යි. කුමාරතුංගයන් දක්වන පරිදි, අන් සියලු නිෂ්පාදන සාධකවල ක්‍රියාකාරීත්වයන්ට වැඩිමනත් දේශීය සංවර්ධනමය ජවයක්, තිරසර බවක් හා ස්වෛරීත්ව ශක්තියක් එකතු කිරීමට දේශවාත්සල්‍යය නමැති පරාමිතියට හැකි බව මෙම විශ්ලේෂණයේ කූටප්‍රාප්ති අනුමිතිය යි. හුදු වෙළෙඳ පොළට ඔබ්බෙන් වූ රටක්-ජාතියක් තිබෙන බවත් දේශමාමකත්වයෙන් තොර වූ ආර්ථික වෘද්ධියක් ජාතික ස්වෛරී තිරසර සංවර්ධනයකට තුඩු නොදෙනු ඇති බවත් ඒ අනුව නිගමනය කළ හැකි වෙයි.

*"අපි දැන් ඉතා දරුණු විපත්ති රාශියකට මුහුණ පා සිටිමු. ..... අපේ අධ්‍යාපනය ද, යටත් පිරිසෙයින් සිය බඩැ ගිනි නිවාගැන්මට වත් මාර්ගයක් සලසාගැනීමෙහි අපොහොසත් වූ, යන මං නොදන්නවුන් විසින් උගන්වන ලදැ යි කියන ගණිත මිනිත ව්‍යාකරණ සාහිත්‍ය ඉතිහාස රස විද්‍යා ප්‍රත්‍යන්ත විද්‍යා යනාදි ගම්භීරාර්ථ නාම මාලාවෙකින් ඉදිමුණු හිස් ඇති බැවින් බැළ මෙහෙයක් කිරීමට ද නුසුදුසු වූ, නිකමුන් රළක් බෝ කෙරෙයි....."*

[ලක් මිණි පහන -2478 බක් අව 5 (1935/04/23),
ලක් මිණි පහන් කතු වැකි, 125-126 පිටු]

*වරක් එ කලැ දත්*
*සියලු ලොවැ රැකි හෙළයෝ*
*අද සිය ගෙට වත්*
*හිමි කම් කීමට පොහොසතු ද ?*

*බැරි බැරි මේ තතු*
*තවත් පවතිනු බැරි මැ යැ*
*හෙළයෝ නැඟෙති මුළු ලොව*
*විස්මවති විරු සිරියෙන්*

*සොහොවුර, ඔබ එහි*
*නො බැඳෙති ද බල පමණින්*
*ඇස'යා අත මෙහෙයා*
*ලොව විනොයා-ලුව මැනැවි*

*පර දෙස වැඳැ වැඳැ*
*පර රසට ගැති කම් පෑ*
*පර බස රෙසෙන් මත් වැ*
*ගෙදර පවා රකිනු බැරි.*

*නිවටයෝ පහත්*
*බලු ගැති කමට මැ විනා*
*බස රැස දෙස රැකුමට*
*කවර ලෙසින් සුදුසු වෙති ?*

*සොහොවුර, ඇති, ඇති,*
*බලා සිටියා නිකමට*
*නැඟෙන්නැ, ගන්නැ, අත'ත*
*යන්නැ, යන්නැ, ඉදිරියට ....*

(කැගල්ලේ හෙළයනට පහිණය, කුමර පැදි සඟනුව, 32 පිටුව)

*සුදුසු මෙහෙයෙකැ - යෙදෙව තැන දැකැ*
*එ ලෙස එඩි රැකැ - ගනුත මිනිසෙකැ*

(විරිත් වැකිය)

*මුලැ දී හෙළිය දුන්*
*හෙළිය මැ අද ද හෙළිය යි*
*එ හෙළ දිව මැ යැ මෙ අද ද*
*හෙළයෝ මැ නො වමු ද අපි ?*

*එළවා හෙළ දිරිය*
*එලවා ගැති කම් සියලු*
*හෙළවා රුපුනො'එ පහළ*
*හෙල වාගේ සිටිත් වා !*

(මාතර හෙළයනට පහිණය, කුමර පැදි සගනුව, 32-33 පිටු)

*පුරවත් වා කිරින් පෑ බඳුනැ'ම දෙන්නූ*
*නො තබත් වා කුඹුරුවලැ හිස් තැන් ගොන්නූ*
*ඉමහත් වාතයෙන් පුලුනෙ'වි දුර පැන්නූ*
*දුකුවත්, වාසනාව මැ වේ වා මින්නූ*

(කුමර පැදි සගනුව, 22 පිටුව)

**පරිශීලිත මූලාශ්‍ර**

*(සිංහල අකාරාදි ශබ්ද අනුපිළිවෙළට යි)*


අබයසිංහ, ටී. බී. එච්. (1966). *පරංගි කෝට්ටෙ 1594-1612*, කොළඹ: ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්

Ali, T. (2017, March 25). How Lenin's love of literature shaped the Russian Revolution. *The Guardian.* Retrieved from https://www.theguardian.com/books/2017/mar/25/lenin-love-literature-russian-revolution-soviet-union-goethe

ඒකනායක, රුවන්. (2019). *කුමාරතුංගයන් රට දුටු හැටි*. ගුරු දෙවි කුමාරතුංග මුනිදාස මහා හෙළයාණෝ - 75 වැනි සමරු දෙසුම.

OECD. (2009). *Evaluation of Agricultural Policy Reforms in Japan*, OECD Publishing, Paris, https://doi.org/10.1787/9789264061545-en.

කුමාරතුංග, ගෙවිඳු. (සංස්.) (2004). *සුවහස් නය මනැසි ඉසිවරයාණෝ - කුමාරතුංග මුනිදාස.* විසිදුනු විමැසුම-1, බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ

කුමාරතුංග, මුනිදාස. (බු.ව. 2478 හෙවත් 1934). *හීන් සැරය*, කොළඹ: පහන් පහර

කුමාරතුංග, මුනිදාස. (බුදු වස රදවර - 2482 හෙවත් 1938). *විරිත් වැකිය*, කොළඹ: පහන් පහර

කුමාරතුංග, මුනිදාස. (බු.ව. 2485 හෙවත් 1941). *හෙළ මීයැසිය*, කොළඹ: එම් ඩී ගුණසේන

කුමාරතුංග, මුනිදාස. (1997). *මඟුල් කෑම*, කොළඹ: එම් ඩී ගුණසේන

කුමාරතුංග, මුනිදාස. (2012). *ප්‍රබන්ධ සංග්‍රහය*, බොරලැස්ගමුව:විසිදුනු ප්‍රකාශකයෝ

කුමාරතුංග, මුනිදාස. (2015). *කියවන නුවණ* (ස වන පොත), බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ

කුමාරතුංග මුනිදාස පදනම. (2006). *ලක්මිණි පහන් කතු වැකි*, බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ

ගණේගම සරණංකර හිමි, (2017). *ජාතියේ පියා හෙවත් අනගාරික ධර්මපාල* (දෙ වැනි මුද්‍රණය). කොළඹ:ගුණසේන ප්‍රකාශකයෝ

Godo, Y. (2013, November 1). The History of Japan's Post-Pacific-War Rice Policy, FFTC Agricultural Policy Platform, Food and Fertilizer Technology Centre for the Asian and Pacific Region, Retrieved from http://ap.fftc.agnet.org/ ap_db.php?id=107&print=1

Jayasundara, J. I. D. (2018). An Innovative Approach to Railway Signalling in Sri Lanka: Appraisal of Technical and Economic Rationale. In T.L. Gunaruwan [Eds.], *Research for Transport and Logistics Industry 2018: Proceedings of the 3rd International Conference*, R4TLI(18)-D3.3, pp 123-128, Sri Lanka Society for Transport and Logistics, Moratuwa: Sri Lanka.

John, R. B. (2008). The Changing Libyan Economy, Causes and Consequences, *Middle East Journal*, Vol. 62 (1), pp. 75-9, Middle East Institute. Washington DC., Retreived from https://doi.org/10.3751/62.1.14

Tatiana A. C. (2006). Estimation of Gross Social Product and Net Material Product in the USSR, Hi-Stat Discussion Paper Series d06-172, Institute of Economic Research, Hitotsubashi University Research Unit for Statistical Analysis in Social Sciences, Tokyo: Japan.

The World Bank. (n.d.). Word Development Indicators, Retrieved from https://databank.worldbank.org/source/world-development-indicators

ප්‍රනාන්දු, සංජීව. (2003). *පොළොන්නරු යුගය*, ගණේමුල්ල: නිශාන්ත ප්‍රකාශන

බටුවන්තුඩාව, රොබට්. (සංස්.) (1967). *මහාවංශය* (හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාව පඬිතුමා, පරි.), (6 වන සංස්කරණය), කොළඹ: රත්නාකර ප්‍රකාශකයෝ

Bhatia, R. (2016 December 07). The Arthashstra in Modi's India. Gateway House. Retrieved from https://www.gatewayhouse.in/the-arthashastra-in-modis-india/

McCormick, K. (1999). The Tao of Laissez-Faire. *Eastern Economic Journal*, 25(3), pp. 331-341. Palgrave Macmilan Journals. Retrieved from https://www.jstor.org/stable/40325935

ලංකාදීප. (2019 දෙසැම්බර් 06). "බඩ ඉරිඟු-කුරක්කන්-කහ-සියඹලා-කොමඩු-පොල් පිටරටින් ගෙන්වලා: ගිය වසරේ වියදම ඩොලර් මිලියන 234 යි", (වාර්තාකරණය: නාලක සංජීව දහනායක), 1 සහ 6 පිටු.

Liebig, M. (2013). Kautilya's Relevance for India Today. *India Quarterly*, 69(2), pp. 99-116, Sage Publications Ltd., Retrieved from DOI: 10.1177/0974928413481881.

විජයතුංග, හරිශ්චන්ද්‍ර. (2001). *කුමාරතුංග ගේ සමාජ දර්ශනය*. (දෙ වැනි මුද්‍රණය). කොළඹ: එම් ඩී ගුණසේන.

වීරසේකර, ජයන්ත. (සංස්.). (බු.ව. 2490 හෙවත් 1946). *කුමර පැදි සගනුව* (කුමාර පද්‍ය සංග්‍රහය, දෙ වන කොටස), කොළඹ: සීමාසහිත ප්‍රින්ටර්ස් සහ ස්ටේෂනරීස් සමාගම

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවිධ වසරවල වාර්ෂික වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුව, ISSN 1391-359X, කොළඹ.

සිටිනාමළුවේ සුමනරතන හිමි, (සංස්.) (1955), *කුමාරතුංග මුනිදාස*, කොළඹ: පෙරමුණ පහරුව

Zicheng, Y. (2015, September 23). How they see Xi's style of governance. *China Daily*. Retrieved from http://www.chinadaily.com.cn/world/2015xivisitus/2015-09/23/content_21962387.htm

Censer, J.R. (2018). Intellectual History and the Causes of the French Revolution, *Journal of Social History*, 52(3), 545-554, Retrieved (on Dec 06, 2019) from https://academic.oup.com/jsh/article/52/3/545/5159508